*සැ. යු.*– 2007.12.20 දින පළ කරන ලද අංක 1,529 දරන *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 1,530 — 2007 දෙසැම්බර් මස 28 වැනි සිකුරාදා — 2007.12.28**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පලකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 1488 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 1502 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවත් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2008 ජනවාරි මස 04 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 දෙසැම්බර් මස 20 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතුය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිළධාරීන් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලකදී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණ සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තාහ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලෙස රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිළධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි :

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිළධාරිහු පූර්වෝක්ත 2 වන වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලටද යටත් විය යුත්තාහ.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලුම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලුම රාජ්‍ය නිලධාරිහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථාද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීනතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකිය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාල සීමාවක් ඇතුළත යථොක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැළසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරීවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත් වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලිම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකිය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නාවූද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබූවා වූද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි :

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යයි ආණ්ඩුව විසින් නියම කරනු ලබන ප්‍රතිශතක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නාවූ නිලධාරින් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිණු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නාවූ නිලධාරින් හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිණු ලැබූ යුද්ධ, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවල යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාල සීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව ඇත්ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතුය.

5. යුද්ධ සේවා අනුග්‍රහය :

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින්ද, සහය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයටද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම්ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම්ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම්ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වු කාල සීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු :

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නා වූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවුත්, නිලධාරින් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූද, නිලධාරින්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකිද යන්න එම නිලධාරින් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත් තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙහි අර්ථ දැක්වීම :

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90 (1) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 දින සිට සිදුකෙරෙනු ඇත.

# විභාගාපේක්ෂකයන් සඳහා නීති හා උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධි විධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියළුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලුම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ.

i. මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම හෝ තහනම් කිරීම.
ii. විභාගයේ එක් විෂයයකට හෝ මුලු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
iii. එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
iv. මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
v. සහතික පත්‍රය යම් කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
vi. විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වග කිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේය.

1. සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසළදීත් විභාගශාලාධිපතින්ටද, ඔහුගේ සහාකාරයින්ටද, අනිකුත් විභාගාපේක්ෂකයින්ටද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතින්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුලු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාගශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීම් ආදියක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සළකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුය. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේදී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම්ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමක් චිත්‍ර කර්මයේදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සළකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැළකීමට හේතු වනවා ඇත.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොල හෝ කෑබලි ද, තමන්ගේ පාට පෙට්ටි හෝ ජ්‍යාමිතික උපකරණ පෙට්ටි අවශ්‍ය අවස්ථාවලදී ඒවා හැර අන්‍ය අත් බෑග්, පසුම්බි පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැමූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ තමා සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොත පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම්ය. විභාගශාලාධිපතින් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සළකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොලයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම හොර උත්තර ලිවීමටද යත්න දැරීම තහනම්ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම් කරුවෙකුට උදව්දීමෙන්ද, වෙන අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබාගැනීමෙන්ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකුටම ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු ලියන විට හෝ විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකයේ වෙනස් කිරීමක් එබඳු වරදවල්ය. විභාගාපේක්ෂකයින් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසියම් අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සළකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය :

i. විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10 කට හෝ 15 කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

ii. යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇතිවූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතු විය හැකිය.

iii. විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්ට දන්වා විභාග අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

iv. විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්, ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මොස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේදී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුසණක වක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

v. විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රේදි කෑළි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

vi. තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිවද පිරිසිදුවද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තැබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

vii. උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහාය. දකුණු පැත්තේ තීරය වෙන් කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

viii. අනිවාර්ය ප්‍රශ්නද, තෝරා ගත යුතු අන් ප්‍රශ්නද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

ix. ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදීත් ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

x. එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන්වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කෑබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

xi. ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සළකණු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

xii. යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විටද කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

# තනතුරු - ඇබෑර්තු

## විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යාංශය

විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යාංශයේ දුරකථන ක්‍රියාකරු/පිළිගැනීමේ නිලධාරී තනතුර සඳහා 2008.01.11 දිනට වයස අවුරුදු 18ට නොඅඩු අවුරුදු 45ට නොවැඩි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. (දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව බල නොපායි.) මෙම නිවේදනය අවසානයේ පළ කර ඇති ආකෘතිය අනුව A4 ප්‍රමාණයේ කඩදාසියේ පිළියෙල කරන ලද අයදුම්පත් 2008.01.11 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලේකම්, විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යාංශය, 33 වන මහල, බටහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙලවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය. දැනට රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ තනතුරු දරන්නන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු හෝ ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

1. දුරකථන ක්‍රියාකරු/පිළිගැනීමේ නිලධාරි :

*අධ්‍යාපන සුදුසුකම්.*– සිංහල/දෙමළ/භාෂාව හෝ සාහිත්‍ය, අංක ගණිතය/වාණිජ අංක ගණිතය/ශුද්ධ ගණිතය/මූලික ගණිතය හා ඉංග්‍රීසි ඇතුළුව විෂයයන් 4කට සම්මාන සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ)විෂයයන් 06කින් සමත් විය යුතුය. (එක් වරකදී විෂයන් 5ක් සමත් විය යුතුය.) ;

හෝ

සිංහල/දෙමළ භාෂාව, ගණිතය, ඉංග්‍රීසි ඇතුළුව විෂයන් 4කට සම්මාන සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී අ. පො. ස. (සා. පෙළ) විෂයන් 06කින් සමත් විය යුතුය. (එක් වරක දී විෂයන් 5ක් සමත් විය යුතුය.) ;

හෝ

පළමු භාෂාව, ගණිතය, ඉංග්‍රීසි ඇතුළුව විෂයයන් 04කට “ඒ” හෝ “බී” ශ්‍රේණියේ සමාර්ථයන් සහිතව ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර විභාගය විෂයන් 06කින් සමත් විය යුතුය. (එක් වරක දී විෂයන් 5ක් වත් සමත් විය යුතුය.)

සහ

මාධ්‍ය භාෂාවට අමතරව සිංහල/ඉංග්‍රීසි/දෙමළ භාෂාවන් චතුර ලෙස කතා කළ හැකි විය යුතුය. දෙමළ භාෂාව මාධ්‍ය භාෂාව නොවන්නේ නම් ඒ පිළිබඳ ව්‍යවහාර දැනුමක් තිබීම විශේෂ සුදුසුකමක් ලෙසද සලකනු ලැබේ.

*වෘත්තීය හා වෙනත් සුදුසුකම්.*– රජයේ හෝ පිළිගත් ආයතනයක අදාල ක්ෂේත්‍රයේ වසර දෙකක පළපුරුද්දක් ලබා තිබීම. (සහතික මගින් සනාථ කළ යුතුයි.)

*වැටුප් බණ්ඩය හා පරිමාණය.*– රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006හි එම්. එන්. 1/2006 වැටුප් බණ්ඩය අදාල වේ.

රු. 12,920-10x120-11x140-10x210-10x290 = රු. 20,660

වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශ ලබාගෙන උසස්වීම් පරිපාටි සකස්කර උසස්වීම් ලබාදෙන තුරු බඳවා ගැනීමේ ශ්‍රේණියට වැටුප රු. 12,920-10x120-රු. 14,120)

*මෙම තනතුර සඳහා සේවා කොන්දේසි* :

(අ) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු, වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(ආ) ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 10 සිට 12 දක්වා පරිච්ඡේදවල විධිවිධාන ද අදාල වේ.

(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 අනුව සේවයට බැඳී වසර 05ක් තුළ සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාවයක් ලබාගත යුතුය.

ආර්. වී. නානායක්කාර,
ලේකම්.

විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යාංශය,
33 වන මහල, බටහිර කුළුණ,
ලෝක වෙළඳ මධ්‍යස්ථානය,
කොළඹ 01.

| කාර්යාලීය ප්‍රයෝජනය සඳහා | |
|---|---|

ආදර්ශ අයදුම්පත්‍රය

විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන අමාත්‍යාංශය

.................................................*තනතුරට බඳවා ගැනීමේ අයදුම්පත්‍රය*

1. මුලකුරු සමඟ නම :—————.
2. සම්පූර්ණ නම :—————.
3. ස්ථිර ලිපිනය :—————.
4. තැපැල් ලිපිනය :—————.
5. ජාතික හැඳුනුම්පත් අංකය :—————.
6. ස්ත්‍රී/පුරුෂ භාවය :—————.
7. (i) උපන් දිනය : අවුරුද්ද :——, මාසය :——, දිනය :——.
   (ii) 2008.01.11 දිනට වයස : අවුරුදු :——, මාස :——, දින :——.
8. විවාහක/අවිවාහක බව :—————.
9. අධ්‍යාපන සුදුසුකම් :—————.
10. වෘත්තීය හා වෙනත් සුදුසුකම් :—————.
11. පළපුරුද්ද :—————.
12. අයදුම්කරුගේ/අයදුම්කාරියගේ සහතිකය :

...............................................................වන මම මෙහි සඳහන් සියලුම කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. යම් හෙයකින් ඉහත තොරතුරු අසත්‍ය බව හෝ වැරදි බව සනාථ වුවහොත් කිසිදු වන්දියක් රහිතව තනතුරෙන් පහ කිරීමට යටත් වන බවද මම දනිමි.

දිනය :—————.

—————.
අයදුම්කරුගේ අත්සන.

13. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :

මෙම ඉල්ලුම්කරු වන ............................................................................................... මහතා/මිය/මෙනවිය දැනට මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ/.................................................................................................වශයෙන් ස්ථිර/තාවකාලික/අනියම්/පුහුණුවන නිලධාරියෙකු/නිලධාරිනියක ලෙස සේවය කරන බවත්, ඔහු/ඇය කිසිදු විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) යටත්කර නොමැති බවත්, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

————.
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව)

දිනය :————.
තනතුර :————.
අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/ආයතනය :————.

12-668

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු - කළුතර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාල උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාස තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හා සෑහෙන දේපලක් හිමි ප්‍රදේශ වාසීන්ගේ සැලකිල්ල ලබන අයද විය යුතුය.

03. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකිය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 21ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 65 ට වැඩිය නොවිය යුතුය.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතුයි.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාල දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදි කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථාන වල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම් වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාල දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2008 ජනවාරි මස 28 දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මඟින් යැවිය යුතුය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2007 දෙසැම්බර් මස 05 වැනි දින,
කොළඹ 11, කෙලින් වීදිය, අංක 280,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| | *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම් පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම් පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|---|
| 01. | කළුතර | බුලත්සිංහල | වෙල්ගම කොට්ඨාසයේ උප්පැන්න හා මරණ සහ නැගෙනහිර පස්දුන් කෝරළය කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කළුතර |
| 02. | කළුතර | බුලත්සිංහල | නැගෙනහිර පස්දුන් කෝරළය මහගම කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | –එම– |

| | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම් පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම් පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|---|
| 03. | කළුතර | වලල්ලාවිට | මීගස්තැන්න කොට්ඨාසයේ උප්පැන්න හා මරණ සහ නැගෙනහිර පස්දුන් කෝරළය කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | –එම– |
| 04. | කළුතර | හොරණ | බණ්ඩාරගම කොට්ඨාසයේ උප්පැන්න හා මරණ සහ රයිගම් කෝරළය කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | –එම– |
| 05. | කළුතර | බේරුවල | කළුතර සහ පානදුර තොටමුන කොට්ඨාසයේ මොල්ලියමලේ ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | –එම– |
| 06. | කළුතර | පානදුර | කළුතර සහ පානදුර තොටමුන කොට්ඨාසයේ හේනමුල්ල ප්‍රාදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | –එම– |

12-673

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු - රත්නපුර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාල උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාස තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හා සැහෙන දේපලක් හිමි ප්‍රදේශ වාසීන්ගේ සැලකිල්ල ලබන අයද විය යුතුය.

03. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකිය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 21ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 65 ට වැඩිය නොවිය යුතුය.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතුයි.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාල දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදි කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථාන වල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම් වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාල දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2008 ජනවාරි මස 28 දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මඟින් යැවිය යුතුය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2007 දෙසැම්බර් මස 05 වැනි දින,
කොළඹ 11, කෙලින් වීදිය, අංක 280,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය

| | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම් පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම් පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|---|
| 01. | රත්නපුර | ගොඩකවෙල | රක්වාන කොට්ඨාසයේ වෙත්තිල කන්ද ප්‍රදේශයේ අතිරේක විවාහ (උඩරට හා සාමාන්‍ය) රෙජිස්ට්‍රාර්ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, රත්නපුර |
| 02. | රත්නපුර | කලවාන | කුකුළු කෝරළය මැදපත්තුව කොට්ඨාසයේ අතිරේක විවාහ (උඩරට හා සාමාන්‍ය) රෙජිස්ට්‍රාර්ධුරය | –එම– |
| 03. | රත්නපුර | කුරුවිට | එල්ලාවල කොට්ඨාසයේ උප්පැන්න හා මරණ සහ කුරුවිට කෝරළය කොට්ඨාසයේ විවාහ (උඩරට හා සාමාන්‍ය) රෙජිස්ට්‍රාර්ධුරය | –එම– |
| 04. | රත්නපුර | කුරුවිට | පාතගම හල්පේ, ඌරුපැලැව්ව සහ කිතුල්පේ කොට්ඨාසයේ අතිරේක විවාහ (උඩරට හා සාමාන්‍ය) රෙජිස්ට්‍රාර්ධුරය | –එම– |
| 05. | රත්නපුර | රත්නපුර | කුරුවිට කෝරළය කොට්ඨාසයයේ රත්නපුර නගර කොට්ඨාසයේ අතිරේක විවාහ (උඩරට හා සාමාන්‍ය) රෙජිස්ට්‍රාර්ධුරය | –එම– |
| 06. | රත්නපුර | කුරුවිට | පුසැල්ල කොට්ඨාසයේ උප්පැන්න හා මරණ සහ කුරුවිට කෝරළය කොට්ඨාසයේ විවාහ (උඩරට හා සාමාන්‍ය) රෙජිස්ට්‍රාර්ධුරය | –එම– |

12-696

---

## පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය

### ප්‍රවාහන නිලධාරි III වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම

පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශයේ ප්‍රවාහන නිලධාරි තනතුරට බඳවා ගැනීම සඳහා සුදුසුකම් ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් මෙයින් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

1. *අවශ්‍ය සුදුසුකම්.–* සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් සුදුසුකම් වලින් යුක්ත විය යුතුය.

(අ) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත වීම ;

(ආ) 2008.01.31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 45ට නොවැඩි වීම (දැනටමත් රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ) ;

(ඇ) *අධ්‍යාපන සුදුසුකම් :*

(i) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව හා තවත් විෂයයකට සම්මාන සහිතව විෂයයන් 6කින් සමත් වී තිබීම. (එක් වරකදී විෂයයන් 5කින් සමත් විය යුතුය.)

හෝ

(ii) ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර විභාගයේදී සිංහල/දෙමළ භාෂාව, ගණිතය. විද්‍යාව සහ තවත් විෂයයකට "A" හෝ "B" ශ්‍රේණියේ සාමාර්ථයන් සහිතව විෂයයන් 6කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත් වී තිබීම. (එක වරකදී විෂයයන් 5 කින් සමත් විය යුතුය).

(ඈ) *වෘත්තීය හා වෙනත් සුදුසුකම් :*

(i) ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ/මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ මෝටර් කාර්මික විද්‍යාව හෝ මෝටර් ඉංජිනේරු විද්‍යාව පිළිබඳව වසර 03කට නොඅඩු පූර්ණකාලීන පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබීම.

(ii) සියළුම වර්ගයේ මෝටර් කාර් හා ලොරි පැදවීම පිළිබඳ වලංගු ප්‍රවීණත්ව සහතිකයක් තිබීම.

(iii) රජයේ පිළිගත් ආයතනයක මෝටර් කාර්මික විද්‍යාව පිළිබඳ අවුරුදු 10ක පළපුරුද්ද හා ඉන් අවුරුදු 05ක් පරීක්ෂකවරයෙකු/පාලන නිලධාරියෙකු වශයෙන් කටයුතු කර තිබීම.

2. *බඳවා ගැනීමේ ක්‍රමය* :

(*අ*) මෙම දැන්වීමේ සඳහන් සියළුම සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 අනුව ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය මගින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. මෙම ලිඛිත පරීක්ෂණයේදී මෝටර් කාර්මික දැනුම, වාහන නඩත්තුව පිළිබඳ දැනුම, මෝටර් වාහන ආඥාපනත සහ මාර්ග නීති පිළිබඳ දැනුම සහ රියදුරු බලපත්‍ර, ආදායම් බලපත්‍ර, රක්ෂණ කටයුතු හා හදිසි අනතුරු සම්බන්ධව ක්‍රියා කිරීම පිළිබඳ දැනුම පරීක්ෂා කරනු ලබන අතර මෙම පරීක්ෂණය සමත්වීම සඳහා 50% අවම ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතුය.

(*ආ*) සම්මුඛ පරීක්ෂණයේදී බඳවා ගැනීමේ ලිඛිත පරීක්ෂණයේ ඉහළම ලකුණු ලබාගත් අයගේ සුදුසුකම් පමණක් පරීක්ෂා කරනු ඇත.

3. *වැටුප් පරිමාණය* :

මෙම තනතුරට හිමි වාර්ෂික වැටුප් පරිමාණය රු. 14,910-10x170-11x180-6x240-14x320 රු. 24,510
රු. 15,420 වැටුප් ලක්ෂ්‍යයට පෙර 1 වැනි කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.

4. *සේවා කොන්දේසි* :

(*අ*) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. අවුරුදු 3ක පරිවාස කාලයකට යටත්ව පත්වීම කරනු ලැබේ.
(*ආ*) වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.
(*ඇ*) ආයතන සංග්‍රහයේ I කාණ්ඩයේ II පරිච්ඡේදයේ 10 - 12 දක්වා වගන්ති අදාල වේ.
(*ඈ*) මෙම *ගැසට් පත්‍රයේ* I කොටසේ II (අ) වගන්තියේ පළ කර ඇති රාජ්‍ය සේවයේ තනතුරුවලට කරන පත්කිරීම් වලට අදාල පොදු කොන්දේසි කෙරෙහිද අයදුම්කරුවන්ගේ අවධානය යොමු කරවනු ලැබේ.
(*ඉ*) තනතුරට බඳවා ගැනීමෙන් පසු වසර 05ක් තුළ 2007.05.28 දිනැති රා. පරි. චක්‍රලේඛ. 07/2007 විධිවිධාන පරිදි රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතුය.

5. අයදුම්කරුවන් පහත සඳහන් ලියවිලි වල පිටපත් ස්වකීය ඉල්ලුම්පත් සමඟ අමුණා එවිය යුතුය :

(i) උප්පැන්න සහතිකයේ සහතික කළ පිටපතක් ;
(ii) අධ්‍යාපන සහතික පිටපත් ;
(iii) ඉහත I ඇ ඡේදයෙහි දක්වා ඇති වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද සනාථ කිරීම සඳහා සහතික/ලිපි පිටපත් (මෙම පිටපත් ආපසු එවනු නොලැබේ).

6. මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත අනුව සකස් කරන ලද අයදුම්පත්, ලේකම්. පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය, අංක 82, සම්පත්පාය, රජමල්වත්ත පාර, බත්තරමුල්ල යන ලිපිනයට 2008.01.31 දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට සැලැස්විය යුතුය. අයදුම්පත එවන ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි "ප්‍රවාහන නිලධාරි තනතුර සඳහා අයදුම්පත්" යනුවෙන් ලියා එවිය යුතුය.

7. රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවාවන්හි නියුතු අයදුම්කරුවන් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් මෙම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

8. අයදුම්පතේ සඳහන් කර ඇත්තා වූ යම් අසත්‍ය තොරතුරක් බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් අයදුම්කරුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය තොරතුරක් බඳවා ගනු ලැබීමෙන් පසු අනාවරණය වුවහොත් සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

9. මෙම නිවේදනයෙන් ආවරණය නොවන කරුණක් සම්බන්ධව තීරණ ගැනීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් අනුව පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශයේ ලේකම් සතු වේ.

එම්. ඒ. ආර්. ඩී. ජයතිලක,
ලේකම්,
පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය.

2007 දෙසැම්බර් මස 11 වැනි දින,
පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය,
අංක 82, සම්පත්පාය,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

12-752

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු – මහනුවර, මාතලේ, මාතර සහ අනුරාධපුරය දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාස වල ඇති විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාල උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාස තුල ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපලක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අයද විය යුතුය.

03. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකිය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 21ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 65ට වැඩිය නොවිය යුතුයි.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතුයි.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාල දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථාන වල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම් වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාල දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2008 ජනවාරි මස 28 දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතුය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2007 නොවැම්බර් මස 30 වැනි දින,
කොළඹ 11, කෙලින් වීදිය, අංක 280,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛන

| | *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|---|
| 01. | මහනුවර | කඩවත් සතර සහ ගඟවට කෝරළය | කඩවත් සතර සහ ගඟවට කොරළය (මහනුවර නගරය) කොට්ඨාසයේ වෛද්‍ය රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, මහනුවර |
| 02. | මහනුවර | කඩවත් සතර සහ ගඟවට කෝරළය | කටුගස්තොට කොට්ඨාසයේ වෛද්‍ය රෙජිස්ට්‍රාර් ධුරය | එම |
| 03. | මහනුවර | කඩවත් සතර සහ ගඟවට කෝරළය | ගඟවට කොරළය කොට්ඨාසයේ උප්පැන්න මරණ සහ මහනුවර නගරය කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | එම |
| 04. | මහනුවර | පාතදුම්බර | පල්ලේගම්පහ නැගෙනහිර උප්පැන්න මරණ සහ පාතදුම්බර කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | එම |
| 05. | මහනුවර | පාතදුම්බර | පාතදුම්බර කොට්ඨාසයේ උඩතලවින්න මඩිහේ ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | එම |
| 06. | මහනුවර | පාතදුම්බර | පාතදුම්බර කොට්ඨාසයේ උඩතලවින්න වත්තේගෙදර මඩිහේ ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | එම |
| 07. | මාතලේ | උකුවෙල | මැදසියපත්තුව නැගෙනහිර කොට්ඨාසයේ උප්පැන්න මරණ සහ මාතලේ දකුණ විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල් මාතලේ |
| 08. | මාතලේ | මාතලේ | මාතලේ නගරය කොට්ඨාසයේ අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | එම |

| | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය |
|---|---|---|---|---|
| 09. | මාතර | මාලිම්බඩ | තෙලිජ්ජවිල කොට්ඨාසයේ උප්පැන්න මරණ සහ වැලිගම් කෝරළය කොට්ඨාසයේ විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල් මාතර |
| 10. | අනුරාධපුරය | ගලෙන්බිඳුනුවැව | උතුරු මාටඹුවා කොට්ඨාසයේ උප්පැන්න මරණ සහ හුරුළු පළාත කොට්ඨාසයේ විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල් අනුරාධපුරය |
| 11. | අනුරාධපුරය | මධ්‍යම නුවරගම් පළාත | අනුරාධපුර පැරණි නගර කොට්ඨාසයේ උප්පැන්න මරණ වෛද්‍ය රෙජිස්ට්‍රාර් ධුරය | එම |
| 12. | අනුරාධපුරය | කැකිරාව | දකුණු කලාගම් කෝරළේ කොට්ඨාසයේ උප්පැන්න මරණ සහ කලාගම් පළාත විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | එම |

12-775

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ උප්පැන්න මරණ සහ විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු අවලංගු කිරීම

මවිසින් පළකරන ලද පහත සඳහන් කොට්ඨාසවල උප්පැන්න මරණ සහ විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවීමේ නිවේදනවල සඳහන් අයදුම්පත් කැඳවීම නව බඳවා ගැනීමේ පටිපාටි ක්‍රියාත්මක කිරීම සඳහා මෙයින් අවලංගු කරමි.

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවූ කොට්ඨාසය සහ තනතුර | ගැසට් පත්‍රයේ අංකය සහ දිනය |
|---|---|---|---|
| මහනුවර | කඩවත් සතර ගඟවට කෝරළේ | කඩවත්සතර ගඟවට කෝරළේ (මහනුවර නගරය) කොට්ඨාසයේ උප්පැන්න මරණ වෛද්‍ය රෙජිස්ට්‍රාර් ධුරය | 1307 සහ 2003.09.19 |
| මහනුවර | පාතදුම්බර | පාතදුම්බර කොට්ඨාසයේ උඩතලවින්න ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | 1241 සහ 2002.06.14 |
| අනුරාධපුර | මධ්‍යම නුවරගම්පළාත | අනුරාධපුර පැරණි නගර කොට්ඨාසයේ උප්පැන්න මරණ වෛද්‍ය රෙජිස්ට්‍රාර් ධුරයට | 1122 සහ 2000.03.03 |

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

12-777

---

## ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව

### උපපොලිස් පරීක්ෂක තනතුර - (විශේෂ කාර්ය බලකාය)

ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ විශේෂ කාර්ය බලකායේ ආධුනික උප පොලිස් පරීක්ෂක, තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පහත දක්වනු ලබන ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් අධ්‍යක්ෂ, බඳවා ගැනීම්, ආධුනිකයින් බඳවා ගන්නා කාර්යාලය, දෙවන මහල, නව මහලේකම් ගොඩනැගිල්ල, කොළඹ 01 යන ලිපිනයට එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම් කෙළවරේ උඩින් තමා අයදුම්කරන තනතුර සඳහන් කර එය ලියාපදිංචි තැපෑලෙන් 2008.01.28 දිනට හෝ ඊට පෙර ඉහත සඳහන් ලිපිනයට අයදුම්පත් ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා නොකරනු ලබන අතර පොලිස් දෙපාර්තමේන්තුව විසින් අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

03. වැටුප් ක්‍රමය.– රු. 1,90,200 - 7 x 2,160 - 2 x 2,880 - 8 x 3,840 - 17 x 4,500 - රු. 3,18,300

ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ලැබේ.

(අ) විශේෂ දුෂ්කර දීමනා.–

(1) මෙහෙයුම් කලාපවල සේවය සඳහා රු. 1,200
(2) මෙහෙයුම් නොවන කලාපවල සේවය සඳහා රු. 600

(ආ) සංයුක්ත දීමනා.–

(1) මෙහෙයුම් කලාපවල සේවය සඳහා රු. 12,000
(2) මෙහෙයුම් නොවන කලාපවල සේවය සඳහා රු. 4,000

(අ) නොමිලේ ගමන් පහසුකම්,
(ආ) නිලධාරීන්ට නොමිලේ වෛද්‍ය පහසුකම් (විදේශ රටකදී වුවද ප්‍රතිකාර කිරීමට මුදලින් ආධාර ලබා ගත හැක),
(ඇ) සියලුම නිළ ඇඳුම් නොමිලේ සපයනු ලැබේ.
(ඈ) තමාගේ ක්‍රීඩා කෞශල්‍යා හා සහජ හැකියාවන් දියුණු කර ගැනීමේ පහසුකම්,
(ඉ) රාජකාරි සඳහා ගමන් වියදම් දුෂ්කර සේවයේ හා විශිෂ්ඨ රාජකාරි සඳහා තෑගි වශයෙන් මුදල් ප්‍රදානය කරනු ලැබේ.
(ඊ) විශේෂ කාර්ය බලකායේ මූලික පුහුණුවෙන් පසු විශේෂ කාර්ය බලකායේ සේවය කරන කාලය තුළ පමණක් විශේෂ කාර්ය බලකායේ අනෙකුත් නිලධාරීන්ට ගෙවනු ලබන විශේෂ දීමනාවලට හිමිකම් ඇත.

04. *අවශ්‍ය මූලික සුදුසුකම් :*

(අ) *වයස් සීමාව.– ගැසට් නිවේදනය* අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18-25 ත් අතර විය යුතුය. එසේ වුවද දැනට පොලිස් දෙපාර්තමේන්තුවේ රාජකාරියේ නියුතු පොලිස් නිලධාරීන්ට හා ආරක්ෂක සහායක නිලධාරීන්ට අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 30 දක්වා අයදුම් කළ හැක.

(ආ) *අධ්‍යාපන සුදුසුකම්.–* අ.පො.ස (සා. පෙළ) විභාගයෙන් එකවර විෂයයන් 06 කින් සමත්ව එම විෂයන් 04 ක් සඳහා සම්මාන සාමාර්ථ තිබිය යුතු අතර ඉන් 02 ක් මාධ්‍ය භාෂාව හා ගණිතය විය යුතුය.

අයදුම්කරු අ.පො.ස (උ.පෙළ) විභාගයෙන් එකවර විෂයයන් 03 ක් සමත්වීම

*සටහන 01* ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂය වර්ගීකරණය අනුව විෂයය අංක 41, 44 දරන විද්‍යා විෂය යුගලය එක් විෂයක් ලෙසද අංක 42 සහ 45 දරන ගණිතය විෂය යුගලය එක් විෂයක් වශයෙන්ද සළකා විභාගයෙන් සමත් විෂයය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

*සටහන 02* අ.පො.ස. (සා. පෙළ) විභාගයේ තාක්ෂණ විෂය ලිඛිත පරීක්ෂණයෙන් අසමත්වීම එම විෂයයේ ප්‍රායෝගික පරීක්ෂණය සමත් වුවද එම විෂය අසමත් ලෙස සලකනු ලැබේ.

*සටහන 03* වෛකල්පිත දෙමළ ඉංග්‍රීසි සහ සිංහල විෂය අ.පො.ස. (සා. පෙළ) විෂය ධාරාවට ඇතුළත් නොවන හෙයින් එම විෂයන් සමත්වීම අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් සමත් විෂයක් ලෙස ගණනය කරනු නොලැබේ.

(ඇ) පහත සඳහන් සුදුසුකම් සපුරාලනු ලබන අයදුම්කරුවන් සම්බන්ධයෙන් වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ. (සහතිකපත් තිබිය යුතුය).

රජයේ හෝ රජය පිළිගත් ආයතනයකින් වසරකට නොඅඩු පරිඝණක ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම

උසස් පෙළ විද්‍යා අංශයෙන් හදාරා තිබීම හා ඉලෙක්ට්‍රෝනික් විද්‍යාව පිළිබඳ වසර 02 ක රජයේ හෝ රජය පිළිගත් ආයතනයකින් ඩිප්ලෝමා පාඨමාලාව හදාරා තිබීම හා එම ක්ෂේත්‍රයේ වසර 02 කට නොඅඩු ප්‍රායෝගික පුහුණුවක් ලබා තිබීම.

ජාතික ඩිප්ලෝමා පාඨමාලාව හෝ සිවි වසරක පූර්ණ කාලීනව රජයේ හෝ රජය පිළිගත් ආයතනයකින් මෝටර් කාර්මික පාඨමාලාව හදාරා තිබීම හා එම ක්ෂේත්‍රයේ වසර 03 ක පළපුරුද්ද.

(ඈ) *ශාරීරික සුදුසුකම්*

උස අඩි 05 අඟල් 06 (අවම)
පපුව අඟල් 32 (අවම/හුස්ම නාල්ලා)

*සටහන .—* විශිෂ්ඨ ක්‍රීඩා කෞෂල්‍යායකින් යුක්තවුත් ජාතික ක්‍රීඩා සංචිතයක සිට ජාතික මට්ටමේ ක්‍රීඩා වලදී විශිෂ්ඨත්වයක් දක්වා ඇති හෝ ජාත්‍යන්තර තරඟයකට සහභාගී වී ශ්‍රී ලංකාවට කීර්තියක් අත්කර දුන් අයදුම්කරුවෙකුගේ ශාරීරික සුදුසුකම් මඳක් අඩු වුවද අනෙක් සුදුසුකම් සපුරා ඇතිනම් පොලිස්පතිගේ අභිමතය පරිදි බඳවා ගැනීම සඳහා සුදුකම් ලබයි.

(ඉ) *දෘෂ්ටිය පිළිබඳ අවශ්‍යතාවයන්* - එක් ඇසක දෘෂ්ඨිය 6/12 අඩු නොවිය යුතුය. දෘෂ්ඨිය එක් ඇසක 6/6 සහ අනෙක් ඇසෙහි 6/18 වේ නම් එයද පිළිගනු ලැබේ. වර්ණ දෘෂ්ඨිය සාමාන්‍ය විය යුතුය. යම් අපේක්ෂකයෙකු උපැස් යුවලක් හෝ ස්පර්ශකාච පාවිච්චි කරන්නේ නම් ඔවුන් සේවයට නුසුදුසු වේ.

(ඊ) *අනෙක් සුදුසුකම්.–* අයදුම්කරු අවිවාහක විය යුතුය. (දික්කසාද වූවන්ද මේ සඳහා විවාහකයින් ලෙස සැලකේ) අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කර තිබෙන දැනටමත් පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය කරන පොලිස් නිලධාරීන්ට හා පොලිස් ආරක්ෂක සහායක නිලධාරීන්ට මෙම කොන්දේසිය පමණක් අදාළ නොවේ.

05. *බඳවා ගැනීමේ ක්‍රමය.* - අයදුම්පත් අනුව සුදුසුකම් ලබන අයදුම්කරුවන් සඳහා පොලිස් දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත් විය යුතුය. මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් පහත සඳහන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය හෙවත් ඔරොත්තුදීමේ පරීක්ෂණය එනම් දරා ගැනීමේ ශක්තිය උරගා බැලීමේ පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

| | | |
|---|---|---|
| (1) මීටර් 1500 | - | මිනිත්තු 06 තත්පර 20 |
| (2) සිටප් (Situp) | - | තත්පර 30 ට වාර 15 |
| (3) ඩිප්ස් (Dips) | - | තත්පර 30 ට වාර 15 |
| (4) ස්කොට්ට්‍රස් (Scott thrush) | - | තත්පර 30 ට 20 |

යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් අවසන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. අවසන් සම්මුඛ පරීක්ෂණයෙන් ලකුණු 40% ක් හෝ ඊට වඩා ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් පමණක් ලිඛිත පරීක්ෂණයට කැඳවනු ලැබේ.

ලිඛිත පරීක්ෂණය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. එනම්

වාක්‍ය රචනය ප්‍රශ්න පත්‍රය කාලය විනාඩි 45 යි. වචන 500 කට නොඅඩු විය යුතුය.

සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය ප්‍රශ්න පත්‍රය කාලය පැය 01 යි

06. *වෛද්‍ය පරීක්ෂණය.–* ප්‍රමුඛතා හා කුසලතා ලැයිස්තුව අනුව තෝරා ගනු ලබන අයදුම්කරුවන් ස්වකීය පත්වීමට පෙර වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් විය යුතුය. වෛද්‍ය පරීක්ෂණයෙන් අසමත් වූවන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. *පසුබිම් පරීක්ෂණය.–*

(අ) අයදුම්කරුගේ යහපත් චරිතය තහවුරු කර ගැනීම සඳහා ඔහු හා ඔහුගේ සමීප ඥාතීන්ගේද, ඔහු ඇසුරු කරන්නන්ගේ යහපත් චරිතය හා හැසිරීම සම්බන්ධව පරීක්ෂණ පවත්වනු ලබන අතර අයහපත් පසුබිම් වාර්තා සහිත අයදුම්කරුවන් බඳවා ගනු නොලැබේ.

(ආ) බඳවා ගැනීමේදී අයදුම්කරුවන් විසින් අසත්‍ය තොරතුරු සැපයීම ඔහු බඳවා ගැනීමට නුසුදුසුකමක් වේ. අසත්‍ය තොරතුරු සැපයූ බව බඳවා ගැනීමෙන් පසුව හෙලි උවහොත් සේවයෙන් ඉවත් කරනු ලැබේ.

08. *රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම.–*

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින්, 2007.04.28 දින නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 07/2007 අනුව 2007.07.01 දින සිට රාජ්‍ය සේවයට/පළාත් රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියලුම නිලධාරීන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාව අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීනතාවයක් සේවයට බැඳී වසර 05 ක් තුළ ලබා ගත යුතුය.

2007.07.01 දින සිට ශ්‍රී ලංකා පොලිස් සේවයට බඳවා ගනු ලබන සහකාර පොලිස් අධිකාරී තනතුරට පහළ තනතුරු දරන නිලධාරීන් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව පවත්වන ද්විතීයික කුසලතා මට්ටමේ භාෂා පාඨමාල පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

පත්වීමේ දින සිට වසර 05 ක් තුළ නියමිත දෙවන භාෂා ප්‍රවනතාව ලබා නොගන්නා නිලධාරීන්ගේ වැටුප් වර්ධක සුදුසුකම් ලබා ගන්නා තෙක් විලම්භනය කරනු ඇත.

09. *පත්වීමේ කොන්දේසි.–* මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුයි.

10. *සේවා කොන්දේසි.–*

(අ) පත්වීම තුන් අවුරුදු ආධුනික කාල පරිච්ඡේදයකට යටත් වනු ඇත.

(ආ) තෝරා ගනු ලබන අයදුම්කරුවන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ද දැනටමත් සම්පාදිතව පවත්නා හෝ මින් මතු සම්පාදනය කරනු ලබන කිසියම් නියෝගයක් වෙතොත් ඒවාටද අනුකූලව කටයුතු කළ යුතුය.

(ඇ) ඔවුහු ආයතන සංග්‍රහයේ පළමුවෙනි සහ දෙවැනි වෙලුමේ අඩංගු නියෝගයන්ටද මුදල් රෙගුලාසි දෙපාර්තමේන්තු නියෝග සහ පොලිස්පතිවරයා විසින් හෝ රජය විසින් හෝ කලින් කලට නිකුත් කරනු ලබන වෙනත් කිසියම් නියෝගයක් වෙතොත් ඒවාටද යටත් විය යුතුය.

(ඈ) තනතුර ස්ථිර කිරීමට පෙර සෑම නිලධාරියෙකුම නියමිත දෙපාර්තමේන්තු පරීක්ෂණ වලින් සමත් විය යුතු වේ. නියමිත පරීක්ෂණයන් ගෙන් සමත්වීමට අපොහොසත් වන්නවුන් හෝ පොලිස් රාජකාරී කටයුතු සඳහා නුසුදුසු යැයි නිගමනය කරනු ලබන අයවලුන්ද සේවයෙන් ඉවත් කිරීමට ඉඩ ඇත.

(ඉ) පත්කර ගනු ලැබූ නිලධාරීන් පොලිස්පතිගේ විශේෂ අවසරය නොමැතිව ඔවුන්ගේ තනතුරෙහි ස්ථිර වනතුරු විවාහ වීමට අවසර දෙනු නොලැබේ. එසේ වුවද 1973 පෙබරවාරි මස 28 දාතමින් පොලිස් ගැසට් 11 අංක 41 දරන නිවේදනය අනුව හා 2006.10.19 දින පොලිස්පති චක්‍රලේඛ අංක 1952/2006 අනුව හා 2007.08.09 දින එම චක්‍ර ලේඛයේ සංශෝධනය අනුව විශේෂ හේතූන් මත පොලිස්පතිගේ අවසරය ඇතිව විවාහ වීමට හැකියාව ඇත.

(ඊ) අයදුම්කරුවන් පත්කර ගනු ලැබ පුහුණුවෙන් පසු අවුරුදු 03 ක පරිවාස සේවා කාලයක් පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය කළ යුතු වන අතර, මෙම පරිවාස සේවා කාලය අවසන් වීමට පෙර ඔවුන් ඉල්ලා අස්වීමට කැමැත්තේ නම් ඔහුගේ පුහුණුව සඳහා නිළ ඇඳුම් ආදිය සම්බන්ධයෙන් දරන්නට සිදු වූ අනෙකුත් වියදම් ඉල්ලා අස්වීමේ ලිපිය භාර දෙන අවස්ථාවේදීම නියම කරන ලද මුදලක් ගෙවීමට කැමැත්ත පළ කිරීමේ ගිවිසුමක් ඔවුන් විසින් අත්සන් කළ යුතුයි. මෙම ගෙවීම ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ අධ්‍යක්ෂ විසින් ගණන් බලා තීරණය කරනු ඇත. ඉල්ලා අස්වීම භාර ගැනීම සම්බන්ධයෙන් 1985 හි 1 වන වෙලුමෙහි ආයතන සංග්‍රහයේ 5 වන පරිච්ඡේදයේ වගන්ති 04 ට අනුකූල විය යුතුය.

(උ) ආධුනික උප පොලිස් පරීක්ෂකවරුන්, පුහුණුව ආරම්භ කල වහාම පොලිස්පති චක්‍රලේඛ 1693/2003 අනුව පොලිස් ආචාර ධර්ම සංග්‍රහයට අනුකූලව ක්‍රියා කරන බවට ප්‍රතිඥා/දිවුරුම් දිය යුතුය.

(ඌ) ආධුනික උප පොලිස් පරීක්ෂකවරුන් පුහුණුව ආරම්භ කල වහාම පොලිස්පති චක්‍ර ලේඛ 1804/2004 අනුව අභිමානවත් රාජ්‍ය සේවයකට කැපවීමේ ස්වයං ප්‍රතිඥාව දිය යුතුය.

(එ) ආධුනික උප පොලිස් පරීක්ෂකවරුන්, පොලිස් දෙපාර්තමේන්තුවේ අනුමත උසස් කිරීමේ පරිපාටි වලට අනුකූලව උසස් කිරීම සඳහා අවකාශ තිබේ.

11. (අ) *ගැසට් පත්‍රයේ* 1 කොටස (II අ) වැනි ඡේදයේ ආරම්භයේ පළකරන ලද රාජ්‍ය සේවා තනතුරු වලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි බලපානු ඇත.

(ආ) 1990.03.10 වෙනි දින අංක 15/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

12. අයදුම්කරුවන් පහත දැක්වෙන ලිපි ලේඛනවල පිටපත් ස්වකීය අයදුම්පත්‍ර වලට අමුණා එවිය යුතුය. (මුල් ලිපි ඉදිරිපත් නොකළ යුතුය)

(අ) උප්පැන්න සහතිකය,
(ආ) චරිතය පිළිබඳව මෑතකදී ලබාගත් සහතික දෙකක් (ඥාතීන් නොවන),
(ඇ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික,
(ඈ) විශේෂ වාර්ථා සහිත ක්‍රීඩා පිළිබඳ සහතික හෝ විෂය බාහිර කටයුතු සම්බන්ධයෙන් ලබාගත් සහතික,
(ඉ) සේවා පළපුරුද්ද සම්බන්ධ සහතික (තිබේ නම් පමණක්),
(ඊ) ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්.

13 (අ) දැනටමත් රාජ්‍ය සේවයෙහි නියුතුව සිටින අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත අදාල දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. අයදුම්කරු තෝරා ගන්නා ලද්දේ නම් ඔහු නිදහස් කළ හැකි බවට සහතිකයක් යා කල යුතුය.

(ආ) අයදුම්කරු විසින් අයදුම්පත් අහල් 11 x 8 ප්‍රමාණයේ කඩදාසිවල ස්වකීය අත්අකුරු වලින්ම සම්පූර්ණ කරනු ලැබූ අදාල සහතික පිටපත් සමග ඉහත දෙවන ඡේදයේ දක්වා ඇති ලිපිනයට ලැබෙන සේ එවිය යුතු අතර කුමන හෝ හේතුවක් නිසාවත් එය කිසියම් නිලධාරියෙකු වෙත පෞද්ගලිකව බාර නොදිය යුතුය.

14. මෙම නිවේදනයෙහි දක්වා ඇති අවශ්‍යතාවයන් සෑම අයුරකින්ම සනාථ නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරනු ඇත. එබඳු අයදුම්කරුවන්ට ඒ සම්බන්ධයෙන් පිළිතුරු එවනු නොලැබේ.

*සටහන.–* පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණ වලට කැඳවනු ලබන අයදුම්කරුවන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

වික්ටර් පෙරේරා,
පොලිස්පති.

## පොලිස් දෙපාර්තමේන්තුව

### ආධුනික උප පොලිස් පරීක්ෂක තනතුර - විශේෂ කාර්ය බලකාය

*ආදර්ශ අයදුම්පත්‍රය*

01. (*අ*) සම්පූර්ණ නම (පැහැදිලි ලොකු අකුරින්) උප්පැන්න සහතිකයේ සඳහන් කර ඇති පරිදිම විය යුතුය :————.

(*ආ*) නම(මුලකුරු සමග) : ————.

(*ඇ*) අයදුම්කරන තනතුර :————.

02. ජාතික හැඳුනුම්පත් අංකය : ————. (ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් ඇමිණිය යුතුයි.)

03. පියාගේ සම්පූර්ණ නම : ————.

04. අයදුම්කරු උපන් ස්ථානය : ————.

උපන් ස්ථානයට අදාළ පොලිස් ස්ථානය : ————.
පළාත : ————.

05. (*අ*) වර්තමාන ලිපිනය : ————.

(*ආ*) වර්තමාන ලිපිනයට අදාල පොලිස් ස්ථානය : ————.

(*ඇ*) ස්ථිර ලිපිනය : ————.

(*ඈ*) ස්ථිර ලිපිනයට අදාළ පොලිස් ස්ථානය හා මැතිවරණ කොට්ඨාසය : ————.

06. (*අ*) ජාතිය : ————.

(*ආ*) ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන්ද ? නැතහොත් ලියාපදිංචි කිරීමෙන් ද ? (ලියාපදිංචි වීමෙන් නම් එම සහතිකයේ පිටපතක් අමුණන්න) : ————.

(*ඇ*) ඔබ පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් නම් උපන් ස්ථානය : ————.

අයදුම්කරු : ————.

අයදුම්කරුගේ පියාගේ : ————.

අයදුම්කරුගේ පිය පක්ෂයේ මුත්තා : ————.

අයදුම්කරුගේ පිය පක්ෂයේ මීමුත්තා : ————.

07. උපන් දිනය : ————. (උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක් ඇමිණිය යුතුයි.)
වයස : (*ගැසට් නිවේදනය* අනුව අයදුම්පත් ඉදිරිපත් කරන දිනට)

අවුරුදු : ————, මාස : ————, දින : ————.

08. උස : අඩි ———, අඟල් ———, පපුව : අඟල් ————.

09. අධ්‍යාපන සුදුසුකම් (සමත්වී ඇති විභාගයන් සඳහන් කර සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි.) : ————.

10. අතිරේක සුදුසුකම් : ————. (සහතිකපතේ ඡායා පිටපතක් ඇමිණිය යුතුයි).

11. විවාහක/අවිවාහක බව : ————.

12. (*අ*) දැනට කරන රැකියාව : ————.
(*ආ*)ඔබ සන්නද්ධ සේවාවක සාමාජිකයෙක් ද ? : ————.

13. ඔබට විශේෂ දක්ෂතාවයන් සහ/හෝ සුදුසුකම් තිබේද? : ————.

14. අයදුම්කරු ගැන විමසුම් කළ හැකි දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන්

(*අ*) ————.
(*ආ*) ————.

15. (*අ*) ඔබ පොලිස් උපසේවයේ හෝ නිත්‍ය පොලිස් සේවාවේ තනතුරක් සඳහා මීට පෙර ඉල්ලුම් කර තිබේද?(එසේ නම් ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න) : ————.

(*ආ*) ඔබ මීට පෙර නිත්‍ය පොලිස් සේවයේ හෝ ශ්‍රී ලංකා පොලිස් උපසේවයේ සේවය කර තිබේද? : ————.
එසේ නම් ඔබ තනතුරින් ඉවත් වූ හේතු සඳහන් කරන්න. : ————.

16. ඔබ ශ්‍රී ලංකා පොලිස් උප සේවයේ සාමාජිකයෙක්ද?, එසේ නම් පත් වීමේ දිනය, නිලය, නිල අංකය සඳහන් කරන්න (පත්වීමේ ලිපියේ පිටපතක් අමුණන්න) : ————.

17. (*අ*) ඔබ සන්නද්ධ සේවාවක සේවය කරන්නේද? එසේ නම් අයදුම්පත අදාල හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය : ————.

(*ආ*) ඔබ සන්නද්ධ සේවාවක සේවය කර ඇත්ද? එසේ නම් අස්වීමේදී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න ? : ————.

18. (*අ*) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයට අනුයුක්තව සිටින්නේද? එසේ නම් අයදුම්පත හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. : ————.

(*ආ*) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයෙහි අනුයුක්තව සිටියේද? එසේ නම් අස්වීමේදී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න : ————.

19. ඔබ කිසියම් අපරාධයක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත්අඩංගුවට ගෙන තිබේද? එසේම අපරාධයක් සම්බන්ධයෙන් වරදකට චෝදනා ලැබ හෝ උසාවියට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ හෝ ඇද්ද ? (එසේ නම් විස්තර සඳහන් කරන්න) : ————.

20. ඔබගේ කිසියම් ඥාතියෙකු අපරාධයක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත්අඩංගුවට ගෙන තිබේද? එසේ නම් කිසියම් අපරාධයක් සම්බන්ධයෙන් වරදකට චෝදනා ලැබ හෝ උසාවියකට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ හෝ ඇද්ද ? එසේ නම් විස්තර සඳහන් කරන්න : ————.

ඉහත කරුණු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි ඒවා බවට මින් සහතික කරමි. එසේම ඉහත දැක්වූ තොරතුරු වැරදි හා අසත්‍ය ඒවා බවට හෙළිවුවහොත් මා සේවයට පත්කර ගෙන ඇතත් ඕනෑම අවස්ථාවකදී පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය වහාම නතර කිරීමට යටත් වන බව දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය : ————.

12-816

## ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව

### පොලිස් කොස්තාපල් හා පොලිස් කොස්තාපල් රියැදුරු තනතුර (විශේෂ කාර්ය බලකාය)

ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ විශේෂ කාර්ය බලකායේ ආධුනික පොලිස් කොස්තාපල් හා පොලිස් කොස්තාපල් රියදුරු තනතුරු සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පහත දක්වනු ලබන ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් අධ්‍යක්ෂ, බඳවා ගැනීම්, ආධුනිකයින් බඳවා ගන්නා කාර්යාලය, දෙවන මහල, නව මහ ලේකම් ගොඩනැගිල්ල, කොළඹ 01, යන ලිපිනයට එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් කෙළවරේ උඩින් තමා අයදුම් කරන තනතුර සඳහන් කර එය ලියාපදිංචි තැපෑලෙන් 2008.03.28 දිනට හෝ ඊට පෙර ඉහත සඳහන් ලිපිනයට අයදුම්පත් ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා නොකරනු ලබන අතර, පොලිස් දෙපාර්තමේන්තුව විසින් අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

03. *වැටුප් ක්‍රමය :*

ආධුනික පොලිස් කොස්තාපල් තනතුර :
රු. 1,71,360-7x1740-10 x 2160-17 x 2880 - රු.2,54,100

පොලිස් කොස්තාපල් රියදුරු තනතුර :
රු. 1,71,360-7x1740-10 x 2160-17 x 2880 - රු.2,54,100

ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ලැබේ.

(අ) *විශේෂ දුෂ්කර දීමනා :*

| | | |
|---|---|---|
| (1) | මෙහෙයුම් කලාපවල සේවය සඳහා | රු. 1,200 |
| (2) | මෙහෙයුම් නොවන කලාපවල සේවය සඳහා | රු. 600 |

(ආ) *සංයුක්ත දීමනා :*

| | | |
|---|---|---|
| (1) | මෙහෙයුම් කලාපවල සේවය සඳහා | රු. 10,500 |
| (2) | මෙහෙයුම් නොවන කලාපවල සේවය සඳහා | රු. 3,500 |

(අ) නොමිලේ ගමන් පහසුකම්,
(ආ) නිලධාරීන්ට නොමිලේ වෛද්‍ය පහසුකම් (විදේශ රටකදී වුවද ප්‍රතිකාර කිරීමට මුදලින් ආධාර ලබා ගත හැක),
(ඇ) සියලුම නිල ඇඳුම් නොමිලේ සපයනු ලැබේ,
(ඈ) තමාගේ ක්‍රීඩා කෞශල්‍ය හා සහජ හැකියාවන් දියුණු කර ගැනීමේ පහසුකම්,
(ඉ) රාජකාරි සඳහා ගමන් වියදම්, දුෂ්කර සේවය හා විශිෂ්ඨ රාජකාරි සඳහා තෑගි වශයෙන් මුදල් ප්‍රදානය කරනු ලැබේ,
(ඊ) විශේෂ කාර්ය බලකායේ මූලික පුහුණුවෙන් පසු විශේෂ කාර්ය බලකායේ සේවය කරන කාලය තුළ පමණක් විශේෂ කාර්ය බලකායේ අනෙකුත් නිලධාරීන්ට ගෙවනු ලබන විශේෂ දීමනාවලට හිමිකම් ඇත.

04. *අවශ්‍ය මූලික සුදුසුකම්.–*

*(අ)* වයස් සීමාව :

ආධුනික පොලිස් කොස්තාපල් තනතුර *:*

*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18-25 ත් අතර විය යුතුය. එසේ වුවද දැනට පොලිස් දෙපාර්තමේන්තුවේ රාජකාරියේ නියුතු ආරක්ෂක සහායක නිලධාරීන්ට අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 30 දක්වා අයදුම්කළ හැක.

පොලිස් කොස්තාපල් රියැදුරු තනතුර *:*

*ගැසට් නිවේදනයට* අනුව අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 19-26 ත් අතර විය යුතුය. එසේ වුවද දැනට පොලිස් දෙපාර්තමේන්තුවේ රාජකාරියේ නියුතු ආරක්ෂක සහායක නිලධාරීන්ට අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 30 දක්වා අයදුම්කළ හැක.

(*ආ*) *අධ්‍යාපන සුදුසුකම් :*

ආධුනික පොලිස් කොස්තාපල් තනතුර :

අ.පො.ස(සා.පෙළ) විභාගයෙන් ගණිතය හා මාධ්‍ය භාෂාව ඇතුලුව එකවර විෂයයන් 06 කින් සමත් විය යුතුය.

පොලිස් කොස්තාපල් රියදුරු තනතුර :

අ. පො. ස. (සා. පෙළ)විභාගයෙන් ගණිතය හා මාධ්‍ය භාෂාව ඇතුලුව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06 කින් සමත්විය යුතුය. වාර දෙකක දී සාමාර්ථය ලබන අපේක්ෂකයෙකු ප්‍රථම වාරයේ දී එකවර විෂයයන් 05 කින් සමත් විය යුතුය.

*සටහන 01* – ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂය වර්ගීකරණය අනුව විෂයය අංක 41, 44 දරන විද්‍යා විෂය යුගලය එක් විෂයක් ලෙස ද, අංක 42 සහ 45 දරන ගණිතය විෂය යුගලය එක් විෂයක් වශයෙන් ද සලකා විභාගයෙන් සමත් විෂයය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

*සටහන 02.*– අ. පො. ස. (සා. පෙළ) විභාගයේ තාක්ෂණ විෂය ලිඛිත පරීක්ෂණයෙන් අසමත්වීම එම විෂයයේ ප්‍රායෝගික පරීක්ෂණය සමත් වුවද එම විෂය අසමත් ලෙස සලකනු ලැබේ.

*සටහන 03* – වෛකල්පිත දෙමළ, ඉංග්‍රීසි හා සිංහල විෂය අ. පො. ස. (සා. පෙළ) විෂය ධාරාවට ඇතුළත් නොවන හෙයින්, එම විෂයයන් සමත්වීම අ. පො. ස. (සා.පෙළ) විභාගයෙන් සමත් විෂයක් ලෙස ගණනය කරනු නොලැබේ.

පහත සඳහන් සුදුසුකම් සපුරාලනු ලබන පොලිස් කොස්තාපල් අයදුම්කරුවන් සම්බන්ධයෙන් වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

රජයේ හෝ රජය පිළිගත් ආයතනයකින් මාස 6 කට නොඅඩු පරිගණක මූලික පාඨමාලාවක් හදාරා තිබීම. (සහතික පත් තිබිය යුතුය).

ඉලෙක්ට්‍රොනික් විද්‍යාව පිළිබඳ මූලික රජයේ හෝ රජය පිළිගත් ආයතනයකින් වසර 2කට නොඅඩු කාලයක් පාඨමාලාව හදාරා තිබීම.

රජයේ හෝ රජය පිළිගත් ආයතනයකින් පූර්ණකාලීනව වසර 3 ක මෝටර් කාර්මික පාඨමාලාව හදාරා තිබීම හා එම ක්ෂේත්‍රයේ වසර 03 ක පළපුරුද්ද.

පහත සඳහන් සුදුසුකම් සපුරාලනු ලබන පොලිස් කොස්තාපල් රියදුරු අයදුම්කරුවන් සම්බන්ධයෙන් වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

රජයේ හෝ රජය පිළිගත් ආයතනයකින් පූර්ණකාලීනව වසර 3ක මෝටර් කාර්මික පාඨමාලාව හදාරා තිබීම හා එම ක්ෂේත්‍රයේ වසර 3ක පළපුරුද්ද.

(*ඇ*) *ශාරීරික සුදුසුකම් :*

ආධුනික පොලිස් කොස්තාපල් තනතුර :

(i) උස අඩි 05, අඟල් 04 (අවම)
(ii) පපුව අඟල් 30 යි (අවම/හුස්ම නාල්ලා)

පොලිස් කොස්තාපල් රියැදුරු තනතුර :

(i) උස අඩි 05, අඟල් 03 (අවම)
(ii) පපුව අඟල් 30 යි (අවම/හුස්ම නාල්ලා)

*සටහන.*– විශිෂ්ඨ ක්‍රීඩා කෞෂල්‍යයකින් යුක්ත වූත්, ජාතික ක්‍රීඩා සංචිතයක සිට ජාතික මට්ටමේ ක්‍රීඩාවල දී විශිෂ්ඨත්වයක් දක්වා ඇති හෝ ජාත්‍යාන්තර තරගයකට සහභාගි වී ශ්‍රී ලංකාවට කීර්තියක් අත්කර දුන් අයදුම්කරුවකුගේ ශාරීරික සුදුසුකම් මදක් අඩු වුවද අනෙක් සුදුසුකම් සපුරා ඇත්නම් පොලිස්පති ගේ අභිමතය පරිදි බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබයි.

පොලිස් කොස්තාපල් රියැදුරු තනතුර :

*(ඈ) වෘත්තීය සුදුසුකම් :*

(i) සැහැල්ලු මෝටර් රථ හෝ බර වාහන පැදවීමේ ප්‍රවීණතා සහතිකය ලබා තිබීම.

(ii) ඉහත බලපත්‍රය ලබා ගැනීමෙන් පසුව අවම වශයෙන් අවුරුදු 01 ක මෝටර් රථ පැදවීමේ පළපුරුද්දක් තිබිය යුතුය.

*සටහන.*– මෝටර් රථ කාර්මික ශිල්පය පිළිබඳ දැනීම, මෝටර් රථ අලුත් වැඩියාව පිළිබඳ පළපුරුද්ද, රිය පැදවීමේ දිගු කාලීන පළපුරුද්ද සඳහා ප්‍රමුඛත්වයක් දෙනු ලැබේ.

රිය පැදවීමේ දක්ෂතාව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන ශාරීරික අවයවයන් හැසිරවීමට බාධා ඇති කරන යම්කිසි අංග විකලත්වයකින් හෝ වෙනත් ශාරීරික ආබාධයකින් පෙළෙන කිසියම් අපේක්ෂකයකු වෙතොත් එම අපේක්ෂකයා සේවයට සුදුසු බවට වෛද්‍ය සහතිකයක් ලබා තිබුණත්, ඔහු නුසුදුස්සකු වනු ඇත.

මූලික සුදුසුකම් තිබෙන අයදුම්කරුවන් වාහන පැදවීම හා නඩත්තු කිරීමේ හැකියාව පිළිබඳ පරීක්ෂා කරනු ලැබේ. එමෙන්ම මාර්ග නීති, රථ වාහන සංඥා ක්‍රම පිළිබඳ අපේක්ෂකයන් ලබා ඇති දැනුමත්, එක් එක් අපේක්ෂකයා පැදවීමට නිපුණත්වය ලබා ඇති වාහනයෙහි යාන්ත්‍රික සිද්ධාන්තයන් පිළිබඳ මූලික දැනුමත් පරීක්ෂා කරනු ලැබේ.

*(ඉ) දෘෂ්ටිය පිළිබඳ අවශ්‍යතාවයන්* : එක් ඇසක දෘෂ්ටිය 6/12 ට අඩු නොවිය යුතුය. එක් ඇසක දෘෂ්ටිය 6/6 සහ අනෙක් ඇසේ දෘෂ්ටිය 6/18 වේ නම් එය ද පිළිගනු ලැබේ. වර්ණ දෘෂ්ටිය සාමාන්‍ය විය යුතුය. යම් අපේක්ෂකයෙකු උපැස් යුවලක් හෝ ස්පර්ශකාච පාවිච්චි කරන්නේ නම් ඔවුන් සේවයට නුසුදුසු වේ.

*(ඊ) අනෙකුත් සුදුසුකම් :*

අයදුම්කරුවන් අවිවාහක විය යුතුය. (දික්කසාද වූවන්ද මේ සඳහා විවාහකයන් ලෙස සැලකේ.) අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කර තිබෙන දැනටමත් පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය කරන පොලිස් ආරක්ෂක සහයක නිලධාරීන්ට මෙම කොන්දේසිය පමණක් අදාළ නොවේ.

05. *බඳවා ගැනීමේ ක්‍රමය* -

අයදුම්පත් අනුව සුදුසුකම් ලබන අයදුම්කරුවන් සඳහා පොලිස් දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත් විය යුතුය. මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් පහත සඳහන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය *හෙවත්* ඔරොත්තු දීමේ පරීක්ෂණය එනම් දරා ගැනීමේ ශක්තිය උරගා බැලීමේ පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

පොලිස් කොස්තාපල් තනතුර :

(1) මීටර් 1500 - මිනිත්තු 06 තත්පර 40

පොලිස් කොස්තාපල් රියැදුරු තනතුර :

(1) මීටර් 1500 - මිනිත්තු 06 තත්පර 40

යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් අවසන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. අවසන් සම්මුඛ පරීක්ෂණයෙන් ලකුණු 40% ක් හෝ ඊට වඩා ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් පමණක් ලිඛිත පරීක්ෂණයට කැඳවනු ලැබේ.

ලිඛිත පරීක්ෂණය (පොලිස් කොස්තාපල් තනතුර) :

ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. එනම්

වාක්‍ය රචනය ප්‍රශ්න පත්‍රය කාලය විනාඩි 45 යි. වචන 500 කට නොඅඩු විය යුතුය.

සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය ප්‍රශ්න පත්‍රය කාලය පැය 01 යි

06. *වෘත්තීමය පරීක්ෂණය.*– (පොලිස් කොස්තාපල් රියැදුරු තනතුර) :

පොලිස් කොස්තාපල් රියැදුරු අයදුම්කරුවන් වෘත්තීමය පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

වෘත්තීමය පරීක්ෂණයේ දී පහත සඳහන් කරුණු පරීක්ෂාවට භාජනය කෙරේ.

(අ) රිය පැදවීමේ ප්‍රවීණතාවය;
(ආ) මාර්ග නීති උපදේශක සංග්‍රහය;
(ඇ) වාහන නඩත්තු කිරීම සහ සුළු අලුත්වැඩියාවන් සම්බන්ධ දැනීම;

*සටහන.*- බඳවා ගනු ලබන පොලිස් කොස්තාපල් රියැදුරන් පරිවාස කාලය අවසන් වීමට ප්‍රථම බර වාහන පැදවීමේ ප්‍රවීණතා සහතිකය ලබා ගෙන පොලිස් විද්‍යාලය මගින් පවත්වනු ලබන බර වාහන පැදවීමේ පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

07. *වෛද්‍ය පරීක්ෂණය.*– ප්‍රමුඛතා හා කුසලතා ලැයිස්තුව අනුව තෝරා ගනු ලබන අයදුම්කරුවන් ස්වකීය පත්වීමට පෙර වෛද්‍ය පරීක්ෂණයකින් වෙතින් සමත් විය යුතුය. වෛද්‍ය පරීක්ෂණයෙන් අසමත් වූවන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08. *පසුබිම් පරීක්ෂණය.*–

(අ) අයදුම්කරුගේ යහපත් චරිතය තහවුරු කර ගැනීම සඳහා ඔහු හා ඔහුගේ සමීප ඥාතීන්ගේද, ඔහු ඇසුරු කරන්නන්ගේ යහපත් චරිතය හා හැසිරීම සම්බන්ධව පරීක්ෂණ පවත්වනු ලබන අතර අයහපත් පසුබිම් වාර්තා සහිත අයදුම්කරුවන් බඳවා ගනු නොලැබේ.

(ආ) බඳවා ගැනීමේදී අයදුම්කරුවන් විසින් අසත්‍ය තොරතුරු සැපයීම ඔහු බඳවා ගැනීමට නුසුදුසුමක් වේ. අසත්‍ය තොරතුරු සැපයූ බව බඳවා ගැනීමෙන් පසුව හෙළි වුවහොත් සේවයෙන් ඉවත් කරනු ලැබේ.

09. *රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම.*–

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින්, 2007.04.28 දින නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 අනුව 2007.07.01 දින සිට රාජ්‍ය සේවයට/පළාත් රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියලුම නිලධාරීන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාවයක් සේවයට බැඳී වසර 05 ක් තුළ ලබා ගත යුතුය.

2007.07.01 දින සිට ශ්‍රී ලංකා පොලිස් සේවයට බඳවා ගනු ලබන සහකාර පොලිස් අධිකාරී තනතුරට පහළ තනතුරු දරන නිලධාරීන් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව පවත්වන ද්විතීයික කුසලතා මට්ටමේ භාෂා පාඨමාලා පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

පත්වීමේ දින සිට වසර 05 ක් තුළ නියමිත දෙවන භාෂා ප්‍රවනතාව ලබා නොගන්නා නිලධාරීන්ගේ වැටුප් වර්ධක සුදුසුකම් ලබා ගන්නා තෙක් විලම්භනය කරනු ඇත.

10. *පත්වීමේ කොන්දේසි.*– මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුයි.

11. *සේවා කොන්දේසි :*

(අ) පත්වීම තුන් අවුරුදු ආධුනික කාල පරිච්ඡේදයකට යටත්වනු ඇත.

(ආ) තෝරාගනු ලබන අයදුම්කරුවන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ද, දැනටමත් සම්පාදිතව පවත්නා හෝ මින් මතු සම්පාදනය කරනු ලබන කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද, අනුකූලව කටයුතු කළ යුතුය.

(ඇ) ඔවුහු ආයතන සංග්‍රහයේ පළමුවෙනි සහ දෙවෙනි වෙළුමේ අඩංගු නියෝගයන්ට ද, මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග සහ පොලිස්පතිවරයා විසින් හෝ රජය විසින් හෝ කලින් කලට නිකුත් කරනු ලබන වෙනත් කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද යටත් විය යුතුය.

(ඈ) (1) තනතුර ස්ථිර කිරීමට පෙර සෑම නිලධාරියෙකුම නියමිත දෙපාර්තමේන්තු පරීක්ෂණවලින් සමත් විය යුතු වේ. නියමිත පරීක්ෂණයන්ගෙන් සමත්වීමට අපොහොසත් වන්නවුන් හෝ පොලිස් රාජකාරී කටයුතු සඳහා නුසුදුසුයැයි නිගමනය කරනු ලබන අයවලුන් ද සේවයෙන් ඉවත් කිරීමට ඉඩ ඇත.

(2) තනතුර ස්ථිර කිරීමට පෙර පොලිස් කොස්තාපල් රියැදුරන් ඉහත ඡේද (අ) 1ට අමතරව බර වාහන පැදවීම සම්බන්ධයෙන් පොලිස් විද්‍යාලය මගින් පවත්වනු ලබන පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

(ඉ) පත්කර ගනු ලැබූ නිලධාරීන් පොලිස්පතිගේ විශේෂ අවසරය නොමැතිව ඔවුන්ගේ තනතුරෙහි ස්ථිර වනතුරු විවාහ වීමට අවසර දෙනු නොලැබේ. එසේ වුවද 1973 පෙබරවාරි මස 28 දාතමින් පොලිස් ගැසට් 11 අංක 41 දරන නිවේදනය අනුව හා 2006.10.19 දින පොලිස්පති චක්‍රලේඛ අංක 1952/2006 අනුව හා 2007.08.09 දින එම චක්‍රලේඛයේ සංශෝධනය අනුව විශේෂ හේතූන් මත පොලිස්පතිගේ අවසරය ඇතිව විවාහ වීමට හැකියාව ඇත.

(ඊ) අයදුම්කරුවන් පත්කර ගනු ලැබූ පුහුණුවෙන් පසු අවුරුදු 03 ක පරිවාස සේවා කාලයක් පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය කළ යුතු වන අතර මෙම පරිවාස සේවා කාලය අවසන් වීමට පෙර ඔවුන් ඉල්ලා අස්වීමට කැමැත්තේ නම් ඔහුගේ පුහුණුව සඳහා නිල ඇඳුම් ආදිය සම්බන්ධයෙන් දරන්නට සිදු වූ අනෙකුත් වියදම් ඉල්ලා අස්වීමේ ලිපිය භාර දෙන අවස්ථාවේදීම නියම කරන ලද මුදලක් ගෙවීමට කැමැත්ත පළ කිරීමේ ගිවිසුමක් ඔවුන් විසින් අත්සන් කළ යුතුයි. මෙම ගෙවීම ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ අධ්‍යක්ෂ විසින් ගණන් බලා තීරණය කරනු ඇත. ඉල්ලා අස්වීම භාර ගැනීම සම්බන්ධයෙන් 1985 හි 1 වන වෙලුමෙහි ආයතන සංග්‍රහයේ 5 වැනි පරිච්ඡේදයේ වගන්ති 04 ට අනුකූල විය යුතුය.

(උ) ආධුනික පොලිස් කොස්තාපල්, පොලිස් කොස්තාපල් රියැදුරන් පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ 1693/2003 අනුව පොලිස් ආචාර ධර්ම සංග්‍රහයට අනුකූලව ක්‍රියා කරන බවට ප්‍රතිඥා/දිවුරුම් දිය යුතුය.

(ඌ) ආධුනික පොලිස් කොස්තාපල්, පොලිස් කොස්තාපල් රියැදුරන් පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ 1804/2004 අනුව අභිමානවත් රාජ්‍ය සේවයකට කැපවීමේ ස්වයං ප්‍රතිඥාව දිය යුතුය.

(එ) ආධුනික පොලිස් කොස්තාපල් පොලිස් කොස්තාපල් රියැදුරන් පොලිස් දෙපාර්තමේන්තුවේ අනුමත උසස් කිරීමේ පරිපාටිවලට අනුකූලව උසස් කිරීම සඳහා අවකාශ තිබේ.

12.(අ) මෙම *ගැසට් පත්‍රයේ* I කොටස (II අ) වැනි ඡේදයේ ආරම්භයේ පළකරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි බලපානු ඇත.

(ආ) 1990.03.10 වෙනි දින අංක 15/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

13. අයදුම්කරුවන් පහත දැක්වෙන ලිපි ලේඛනවල පිටපත් ස්වකීය අයදුම්පත්‍රවලට අමුණා එවිය යුතුය. (මුල් ලිපි ඉදිරිපත් නොකළ යුතුය)

(අ) උප්පැන්න සහතිකය
(ආ) චරිතය පිළිබඳව මෑතකදී ලබාගත් සහතික දෙකක් (ඥාතීන් නොවන)
(ඇ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික
(ඈ) විශේෂ වාර්තා සහිත ක්‍රීඩා පිළිබඳ සහතික හෝ විෂය බාහිර කටයුතු සම්බන්ධයෙන් ලබාගත් සහතික
(ඉ) සේවා පළපුරුද්ද සම්බන්ධ සහතික (තිබේ නම් පමණක්)
(ඊ) ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්

14. (අ) දැනටමත් රාජ්‍ය සේවයෙහි නියුක්තව සිටින අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත අදාල දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. අයදුම්කරු තෝරා ගන්නා ලද්දේ නම් ඔහු නිදහස් කළ හැකි බවට සහතිකයක් යාකළ යුතුය.

(ආ) අයදුම්කරු විසින් අයදුම්පත් අඟල් 11 x 8 ප්‍රමාණයේ කඩදාසිවල ස්වකීය අත් අකුරුවලින්ම සම්පූර්ණ කරනු ලැබූ අදාළ සහතික පිටපත් සමඟ ඉහත දෙවන ඡේදයේ දක්වා ඇති ලිපිනයට ලැබෙන සේ එවිය යුතු අතර, කුමන හෝ හේතුවක් නිසාවත් එය කිසියම් නිලධාරියෙකු වෙත පෞද්ගලිකව භාර නොදිය යුතුය.

15. මෙම නිවේදනයෙහි දක්වා ඇති අවශ්‍යතාවයන් සෑම අයුරකින්ම සනාථ නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. එබඳු අයදුම්කරුවන්ට ඒ සම්බන්ධයෙන් පිළිතුරු එවනු නොලැබේ.

*සටහන.–* පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයදුම්කරුවන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

වික්ටර් පෙරේරා,
පොලිස්පති.

පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

පොලිස් දෙපාර්තමේන්තුව

*ආධුනික පොලිස් කොස්තාපල් හා පොලිස් කොස්තාපල් රියැදුරු තනතුර*

*ආදර්ශ අයදුම්පත්‍රය*

01. (අ) සම්පූර්ණ නම (පැහැදිලි ලොකු අකුරින්) උප්පැන්න සහතිකයේ සඳහන් කර ඇති පරිදිම විය යුතුය : ——————.

(*ආ*) නම(මුලකුරු සමග): ——————.

(*ඇ*) අයදුම්කරන තනතුර : ——————.

02. ජාතික හැඳුනුම්පත් අංකය : ——————. (ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් ඇමිණිය යුතුයි.)

03. පියාගේ සම්පූර්ණ නම : ——————.

04. අයදුම්කරු උපන් ස්ථානය : ——————.

උපන් ස්ථානයට අදාළ පොලිස් ස්ථානය : ——————.
පළාත : ——————.

05. (*අ*) වර්තමාන ලිපිනය : ——————.

(*ආ*) වර්තමාන ලිපිනයට අදාළ පොලිස් ස්ථානය : ——————.

(*ඇ*) ස්ථිර ලිපිනය : ——————.

(*ඈ*) ස්ථිර ලිපිනයට අදාළ පොලිස් ස්ථානය හා මැතිවරණ කොට්ඨාසය : ——————.

06. (අ) ජාතිය : ——————.

(ආ) ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන්ද ? නැතහොත් ලියාපදිංචි කිරීමෙන් ද ? (ලියාපදිංචි වීමෙන් නම් එම සහතිකයේ පිටපතක් අමුණන්න) : ——————.

(*ඇ*) ඔබ පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් නම් උපන් ස්ථානය :

අයදුම්කරු : ——————.

අයදුම්කරුගේ පියා : ——————.

අයදුම්කරුගේ පිය පක්ෂයේ මුත්තා : ——————.

අයදුම්කරුගේ පිය පක්ෂයේ මීමුත්තා : ——————.

07. උපන් දිනය : ——————. (*උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි.*)
වයස : (*ගැසට් නිවේදනය අනුව අයදුම්පත් ඉදිරිපත් කරන දිනට*)

අවුරුදු : ———, මාස : ———, දින : ———.

08. උස : අඩි ————, පපුව : අඟල් ————.

09. අධ්‍යාපන සුදුසුකම් (සමත්වී ඇති විභාගයන් සඳහන් කර සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි.) : ——————.

10. අතිරේක සුදුසුකම් : ——————. (සහතිකපතේ ඡායා පිටපතක් ඇමිණිය යුතුයි).

11. විවාහක/අවිවාහක බව : ——————.

12. (*අ*) දැනට කරන රැකියාව : ——————.
(*ආ*)ඔබ සන්නද්ධ සේවාවක සාමාජිකයෙක් ද ? : ——————.

13. ඔබට විශේෂ දක්ෂතාවයන් සහ/හෝ සුදුසුකම් තිබේද? : ————.

14. අයදුම්කරු ගැන විමසුම් කළ හැකි දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන්

(අ) : ——————.
(ආ) : ——————.

15. (*අ*) ඔබ පොලිස් උපසේවයේ හෝ නිත්‍ය පොලිස් සේවාවේ තනතුරක් සඳහා මීට පෙර ඉල්ලුම් කර තිබේද?(එසේ නම් ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න) : ——————.

(*ආ*) ඔබ මීට පෙර නිත්‍ය පොලිස් සේවයේ හෝ ශ්‍රී ලංකා පොලිස් උපසේවයේ සේවය කර තිබේද? එසේ නම් ඔබ තනතුරින් ඉවත් වූ හේතු සඳහන් කරන්න. : ——————.

16. ඔබ ශ්‍රී ලංකා පොලිස් උපසේවයේ සාමාජිකයෙක්ද?, එසේ නම් පත් වීමේ දිනය, නිලය, නිල අංකය සඳහන් කරන්න (පත්වීමේ ලිපියේ පිටපතක් අමුණන්න) : ——————.

17. (*අ*) ඔබ සන්නද්ධ සේවයක සේවය කරන්නේද? එසේ නම් අයදුම්පත අදාළ හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. : ——————.

(*ආ*) ඔබ සන්නද්ධ සේවාවක සේවය කර ඇත්ද? එසේ නම් අස්වීමේදී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න ? : ——————.

18. (*අ*) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයට අනුයුක්තව සිටින්නේද? එසේ නම් අයදුම්පත හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. : ——————.

(*ආ*) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයෙහි අනුයුක්තව සිටියේද? එසේ නම් අස්වීමේදී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න. : ——————.

19. ඔබ කිසියම් අපරාධයක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත්අඩංගුවට ගෙන තිබේද? එසේම අපරාධයක් සම්බන්ධයෙන් වරදකට චෝදනා

ලැබ හෝ උසාවියට කැඳවනු ලැබ හෝ දඩුවම් ලැබ හෝ ඇත්ද ? (එසේ නම් විස්තර සඳහන් කරන්න): ————.

20. ඔබගේ කිසියම් ඥාතියෙකු අපරාධයක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත්අඩංගුවට ගෙන තිබේද? එසේ නම් කිසියම් අපරාධයක් සම්බන්ධයෙන් වරදකට චෝදනා ලැබ හෝ උසාවියකට කැඳවනු ලැබ හෝ දඩුවම් ලැබ හෝ ඇද්ද ? (එසේ නම් විස්තර සඳහන් කරන්න) : : ————.

ඉහත කරුණු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි ඒවා බවට මින් සහතික කරමි. එසේම ඉහත දැක්වූ තොරතුරු වැරදි හා අසත්‍ය ඒවා බවට හෙළිවුවහොත් මා සේවයට පත්කර ගෙන ඇතත් ඕනෑම අවස්ථාවකදී පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය වහාම නතර කිරීමට යටත් වන බවද දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය : ————.

12-817

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## යොවුන් සේනාංකය

## තරුණ කටයුතු අමාත්‍යාංශය

### යොවුන් සේනාංක රේන්ජර් පුහුණු මධ්‍යස්ථාන සඳහා ආධුනිකයින් බඳවා ගැනීම - 2008

### "අසිරිමත් පරපුරක් උදෙසා සදාතනික නවාතැනක්"

පාසල් අධ්‍යාපනය නිම කර සිටින ඔබට සාර්ථක අනාගතයකට අවශ්‍ය දැනුම, පෞරුෂත්ව සංවර්ධනය, භාෂා කුසලතා සංවර්ධනය සහ පරිගණක සාක්ෂරතාවය ලබා දෙමින්, ඔබේ අනාගත ඉලක්ක විශිෂ්ඨ ලෙස ජය ගැනීම සඳහා අවශ්‍ය සවිමත් පදනම "පාසැලෙන් වැඩ බිමට" තේමාව යටතේ ගොඩ නැගීම යොවුන් රේන්ජර් වැඩසටහනේ මූලික අරමුණයි. මෙරට හා පිටරට රැකියා ඉලක්ක කර ගත් පුහුණු වැඩ සටහන් මෙන්ම ආත්ම අභිමානයෙන් යුතුව ඔප් නැංවූ සහජ හැකියා තුලින් අනාගතය සාර්ථක කර ගැනීමට බලාපොරොත්තුවන තරුණ තරුණියන්ට මෙම වැඩසටහන සඳහා අයදුම් කළ හැක.

2. *බඳවා ගැනීමේ සුදුසුකම්.–*

2008.01.16 දිනට වයස අවුරුදු 16 ත් 26ත් අතර වයස් කාණ්ඩයට අයත් වීම.

පාසැල් අධ්‍යාපනය නිම කර තිබීම හා අවම වශයෙන් 8 වසර සමත් වී තිබීම

බාලදක්ෂ, ශිෂ්‍ය භට, ක්‍රීඩා හා වෙනත් බාහිර ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වී තිබීම විශේෂ සුදුසුකමකි.

3. *පුහුණු පාඨමාලා ආරම්භ කරන දිනයන්.–*

2008 ජනවාරි 16 (2008 1 වන බඳවා ගැනීම)
2008 ජුලි 16 (2008 11 වන බඳවා ගැනීම)

4. *පාඨමාලාවේ සංයුතිය.-*

ආයතනික පුහුණුව (සියලු වැඩ කරන දිනයන්හි උදෑසන 07.30 සිට සවස 04.30 දක්වා)
සවිබල ගැන්වීම
මාස 06 ක ආයතනික පුහුණුව අවසානයේ වෘත්තීය පුහුණුව සඳහා යොමු කිරීම.

| *ආයතනික පුහුණුව* | *සවිබල ගැන්වීම* |
|---|---|
| භාෂා නිපුණත්වය (ඉංග්‍රීසි සහ දෙමළ) | බැහැරගත පුහුණුව |
| පරිගණක පුහුණුව | ව්‍යවසායකත්ව සංවර්ධනය |
| සණ සරඹ හා ශාරීරික අභ්‍යාස | ප්‍රජා සංවර්ධන ක්‍රියාකාරකම් |
| වෘත්තීය මාර්ගෝපදේශනය හා උපදේශනය | පුද්ගල හා සමූහ පැවරුම් |
| සමාජ විද්‍යාව | ජීවනෝපාය සංවර්ධනය |
| ජාතික උරුමය | භාවනා මගින් මානසික ඒකාග්‍රතාවය |
| සෞන්දර්යය අධ්‍යාපනය (නර්ථනය, සංගීතය, චිත්‍ර කලාව) | |
| පෞරුෂ සංවර්ධනය. | |

5. *ඔබට ලැබෙන ප්‍රතිලාභ.–*

* කාර්මික අධ්‍යාපනය හා වෘත්තීය පුහුණුව සඳහා යොමු කිරීම.
* මාස 06ක පුහුණු කාලය තුල මසකට රු. 1,000 බැගින් දිරි දීමනාවක් ගෙවීම.
* රු. 3,000ක උපරිමයකට යටත්ව නිල ඇඳුම් දීමනාව හෝ නිල ඇඳුම් ලබා දීම.
* පුහුණු කාලය තුල උදේ හා දිවා ආහාරය හා තේ පැන්.
* ක්‍රීඩා සම්බන්ධ පුහුණු වැඩමුළු, තරුණ කඳවුරු සඳහා සහභාගීත්වය.
* පුහුණුව අවසානයේ පිළිගත් සහතිකයක් ලබාදීම.
* වෘත්තීය පුහුණුව සඳහා රු. 10,000ක උපරිමයක් යටතේ දීමනාවක් ලබා දීම.

6. *අයදුම්පත් යොමු කිරීම*.- ආදර්ශ අයදුම්පත අනුව ඔබ විසින් සකස් කළ ඉල්ලුම්පත් 2008.01.10 දින හෝ ඊට පෙර ලැබෙන පරිදි ආසන්නතම යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය වෙත යොමු කරන්න.

7. *සම්මුඛ පරීක්ෂනය*.- යොවුන් සේනාංක වැඩසටහන සඳහා බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණය ඔබ විසින් ඉල්ලුම් කළ යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථායේ දී 2008.01.10 දින පෙ. ව. 9.00 සිට පැවැත්වේ. සම්මුඛ පරීක්ෂණය අවසානයේ තෝරාගත් අයදුම්කරුවන්ට ඒ බව දැනුම් දෙනු ලැබේ.

8. *පුහුණු පාඨමාලාව ආරම්භ කිරීම*.- 2008.01.10 දින සිට පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණ මගින් තෝරාගන්නා අයදුම්කරුවන්ගේ පුහුණුව 2008.01.16 දින ආරම්භ වේ.

අධ්‍යක්ෂ,
යොවුන් සේනාංකය.

යොවුන් සේනාංක මූලස්ථානය,
අංක 974/4, පන්නිපිටිය පාර,
බත්තරමුල්ල.

දුරකථන අංක : 060-2152660/661/662/663/664

### යොවුන් දිරිය - අයදුම් පත්‍රය

1. දිස්ත්‍රික්කය : ______ 2. ඡන්ද කොට්ඨාසය : ______

3. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : ______ 4. ග්‍රාම නිලධාරි කොට්ඨාසය : ______

5. පුහුණුවීම සඳහා ඉල්ලුම් කරන යොවුන් දිරිය පුහුණු මධ්‍යස්ථානයේ නම : ______

6. සම්පූර්ණ නම පෙළපත් නාමය සමග (ජාතික හැඳුනුම්පතේ සඳහන් පරිදි:) : ______

7. මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි අකුරුවලින්) : ______

8. ස්ථිර ලිපිනය : ______

9. උපන් දිනය : ______ 2007.01.01 දිනට වයස අවු. : ______ මාස : ______ දින : ______

10. ජාතික හැඳුනුම්පත් අංකය : ______ 11. ස්ත්‍රී පුරුෂ භාවය : ______

12. අධ්‍යාපන සුදුසුකම් : (1) අ.පො.ස. (උ/පෙ) සමත් ☐ (2.) අ.පො.ස. (සා/පෙ) ☐

(3) 8 සමත් ☐ (4) 8 දක්වා උගත් ☐

13. අනෙකුත් බාහිර ක්‍රියාකාරකම් :

(පාසල් ශිෂ්‍ය නායක, ක්‍රීඩා නායක, නිවාසාන්තර, දිස්ත්‍රික්, පළාත් සහ ජාතික මට්ටමේ ක්‍රීඩා කරන සහ සමිති සමාගම් ස්වේච්ඡා සංවිධාන, දහම් පාසල්වල කටයුතු කර ඇත්නම් එම තොරතුරු)

14. නිර්මාණශීලී ක්‍රියාකාරකම් :

15. දැනට රැකියාවක නිරතවන්නේ නම් ඒ පිළිබඳ විස්තර :

16. අනාගත වෘත්තීය අපේක්ෂාව

1. රාජ්‍ය අංශයේ රැකියාවක් ☐ 2. පෞද්ගලික අංශයේ රැකියාවක් ☐

3. තමාගේම ව්‍යාපාරයක් ☐ 4. විදේශ රැකියාවක්: ☐

5. සහජ හැකියාවට රැකියාවක් ☐ 6. වෙනත් ☐

මා විසින් ඉහත සඳහන්කර ඇති තොරතුරු සත්‍ය බවටත් මම මෙයින් ප්‍රකාශ කර සිටිමි.

————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

## යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථාන ලේඛනය

| *දිස්ත්‍රික්කය* | *මැතිවරණ කොට්ඨාසය* | | *යොවුන් දිරිය මධ්‍යස්ථානයේ නම සහ ලිපිනය* | *දුරකථන අංකය* |
|---|---|---|---|---|
| ගම්පහ | 1 | බියගම | හෙයියන්තුඩුව, මාකොළ දකුණ, මාකොළ | 011-2964040 |
| | 2 | කටාන | ධම්මාලෝක මාවත, වලහන්කඩ, කටුනායක | 011-2260020 |
| | 3 | අත්තනගල්ල | වතුපිටිවල,අත්තනගල්ල, නිට්ටඹුව | 033-2282232 |
| | 4 | දොම්පේ | නැඳුන්ගොල්ලවත්ත, මණ්ඩාවල, දොම්පෙ, | 060-2339834 |
| | 5 | ගම්පහ | වැරැල්ලවත්ත, යක්කල, ගම්පහ | 033-2233534 |
| | 6 | දිවුලපිටිය | වල්පිට, හෙට්ටිපොල, දිවුලපිටිය | 033-2272875 |
| කලුතර | 7 | බුලත්සිංහල | බුලත්සිංහල | 034-2282322 |
| මාතලේ | 8 | ලග්ගල | නාඋල, අරන්ගල, නාඋල | 066-2246204 |
| | 9 | දඹුල්ල | ඉනාමලුව, දඹුල්ල | 060-2665230 |
| මහනුවර | 10 | ගම්පොල | ගුරු අභ්‍යාස විද්‍යාලය, ගම්පොල | 081-2352335 |
| නුවරඑළිය | 11 | නුවරඑළිය | මීපිළිමාන, අඹේවෙළ, නුවරඑළිය | 060-2536332 |
| | 12 | හඟුරන්කෙත | රිකිල්ලගස්කඩ, හඟුරන්කෙත | 081-2365849 |
| ගාල්ල | 13 | ගාල්ල | වැකුණුගොඩ, බෝපෙ, ගාල්ල | 091-2233182 |
| | 14 | අක්මීමණ | ඉහළගොඩ, වලහන්දුව, අක්මීමණ | 091-2239595 |
| මාතර | 15 | අකුරැස්ස | මාරඹ, අකුරැස්ස | 041-4921003 |
| හම්බන්තොට | 16 | තන්ගල්ල | හුංගම, එරමිණියාය | 060-2489156 |
| | 17 | මුල්කිරිගල | නයිගල, හකුරුවෙල, වීරකැටිය | 047-2257143 |
| | 18 | තිස්සමහාරාමය | සූරියවැව, තිස්සමහාරාමය | 047-2288169 |
| ත්‍රිකුණාමලය | 19 | කන්තලේ | සීනිපුර, කන්තලේ | 026-2244088 |
| පුත්තලම | 20 | නාත්තන්ඩිය | සාගරගම, නාත්තන්ඩිය | 032-5673377 |
| කුරුණෑගල | 21 | කුලියාපිටිය | දෙගම්මැද, වැවගම, කුලියාපිටිය | 060-2879228 |
| | 22 | වාරියපොල | උසාවි මාවත, වාරියපොල | 060-2973575 |
| | 23 | මාවතගම | ඩෙන්වෝර්වත්ත, මාවතගම | 037-2298668 |
| | 24 | පඩුවස්නුවර | නුගවැල හන්දිය, තුත්තිරිපිටිගම, පඩුවස්නුවර | 037-2291803 |
| | 25 | දොඩන්ගස්ලන්ද | අලකොළමඩ, මදුරාගොඩ, දොඩන්ගස්ලන්ද | 037-4924982 |

| දිස්ත්‍රික්කය | මැතිවරණ කොට්ඨාසය | | යොවුන් දිරිය මධ්‍යස්ථානයේ නම සහ ලිපිනය | දුරකථන අංකය |
|---|---|---|---|---|
| අනුරාධපුරය | 26 | කැකිරාව | මහවැලි පෙදෙස, කැකිරාව | 025-2263297 |
| | 27 | කලාවැව | ගල්නෑව, බුල්නෑව, කළාවැව | 025-2269946 |
| | 28 | සාලියපුර | පාලාඩිකුලම්, අනුරාධපුරය | 025-2222297 |
| පොලොන්නරුව | 29 | පොලොන්නරුව | හංසයා පාළම, අරලගංවිල, පොලොන්නරුව | 060-2279016 |
| බදුල්ල | 30 | බණ්ඩාරවෙල | බිඳුණුවැව, බණ්ඩාරවෙල | 057-2222214 |
| | 31 | මහියංගනය | මාපාකඩ වැව, මහියංගනය | 055-2257059 |
| මොණරාගල | 32 | වැල්ලවාය | සර්වෝදය මධ්‍යස්ථානය, තණමල්විල | 060-2473112 |
| කෑගල්ල | 33 | දැරණියගල | බටංගල, පනාවල, දැරණියගල | 036-2258108 |
| | 34 | ගලිගමුව | ආසියදෙණිය, ගලිගමුව | 060-2359735 |
| | 35 | කෑගල්ල | ගංගොඩවත්ත, කෑගල්ල | 060-2152600 |
| රත්නපුරය | 37 | නිවිතිගල | අම්බලන්දෙනිය, වටාපොත පාර, නිවිතිගල | 045-2279970 |

12-666

---

## සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

### ටවර් හෝල් රඟහල පදනම/ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

### අධ්‍යාපනවේදී (නාට්‍ය හා රංගකලාව) උපාධිය
**Bachelor of Education (Drama and Theatre) Degree**

සඳහා

### නාට්‍ය හා රංගකලාව පිළිබඳ දෙවර්ෂ පූර්ණකාලීන උසස් ඩිප්ලෝමාව
**Full time two year course of Higher Diploma in Drama and Theatre**
අධ්‍යයන වර්ෂ 2008/2009

ජාත්‍යන්තර රංගකලා ආයතනයේ ශ්‍රී ලාංකීය සාමාජිකත්වලාභී, ටවර් හෝල් රඟහල පදනමට අනුබද්ධ නාට්‍ය හා රංගකලා පාසල මගින් නාට්‍ය හා රංගකලාව පිළිබඳ දෙවර්ෂ පූර්ණ කාලීන උසස් ඩිප්ලෝමා පාඨමාලාව මෙහෙයවයි. ඉන් සමත් වීමෙන් පසුව ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයෙහි අධ්‍යාපන පීඨය මගින් මෙහෙයවන අධ්‍යාපනවේදී නාට්‍ය හා රංගකලා උපාධිය B. Ed. (Drama and Theatre) සඳහා ඇතුළත් වීමට සුදුසුකම් ලබයි. ඒ සඳහා ඇතුළත් වීමට පදනම් වන නාට්‍ය හා රංගකලාව පිළිබඳ දෙවර්ෂ පූර්ණ කාලීන උසස් ඩිප්ලෝමාව, ටවර් හෝල් රඟහල පදනමට අනුබද්ධ නාට්‍ය හා රංගකලා පාසල මගින් මෙහෙයවනු ලබන අතර, ඒ සඳහා සුදුසුකම්ලාභීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මේ සඳහා එක් අධ්‍යයන වර්ෂයක් සඳහා බඳවාගනු ලබන්නේ සීමිත සංඛ්‍යාවක් පමණක් වන අතර, ඕනෑම විෂය ධාරාවක් යටතේ අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ සමත්, අවුරුදු 30ට අඩු අයදුම්කරුවන්ගෙන් අයදුම්පත්‍ර කැඳවනු ලැබේ :

| *අධ්‍යයන වර්ෂ* | *මෙහෙයවීම* | *උපාධිය/ උසස් ඩිප්ලෝමාව* | *පූර්ණ කාලීන අර්ධ කාලීන* |
|---|---|---|---|
| 01 | ටවර් රඟහල පදනමේ | උසස් ඩිප්ලෝමාව I වසර | පූර්ණ කාලීන/ |
| 02 | නාට්‍ය හා රංගකලා පාසල | උසස් ඩිප්ලෝමාව II වසර | නේවාසික |
| 03 | ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය | අධ්‍යාපනවේදී උපාධිය III වසර | අර්ධකාලීන |
| 04 | අධ්‍යාපන පීඨය | අධ්‍යාපනවේදී උපාධිය IV වසර | |

*නාට්‍ය හා රංගකලාව පිළිබඳ දෙවර්ෂ පූර්ණ කාලීන උසස් ඩිප්ලෝමාව සඳහා ගාස්තු :*

| | |
|---|---|
| අධ්‍යයන ගාස්තු (වර්ෂ දෙකටම) | රු. 20,000 0 |
| වෙනත් (පුස්තකාල, ලියාපදිංචි හා තිල ඇඳුම්) | රු. 3,500 0 |

අදාළ අයදුම්කරුවන් විසින් ගෙවන කාර්යාලය, "බොරැල්ල" වශයෙන් අධ්‍යක්ෂ ජනරාල් නමට රු. 300ක මුදල් ඇණවුමක් සමග තමාගේ නම සහ ලිපිනය ලියූ 9" x 4" ප්‍රමාණයේ මුද්දර කවරයක් පහත ලිපිනයට එවා හෝ පැමිණීමෙන් විස්තර හා අයදුම්පත් ලබාගත හැකිය. මේ සඳහා කලින් අයදුම්කළ අය නැවත අයදුම් කළ යුතු නොවේ :

අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනය - 2007 දෙසැම්බර් 31

නීතිඥ ඩග්ලස් සිරිවර්ධන,
අධ්‍යක්ෂ ජනරාල්,
ටවර් හෝල් රඟහල පදනම,
"සවිසිරිපාය", අංක 123,
විජේරාම මාවත,
කොළඹ 07.
දුරකථන අංක : 2682324/2387141
E-mail:towers @sltnet.lk web:towerhall.lk

12-703

---

## සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය

### අතුරු වෛද්‍ය සේවාවේ පාසල් දන්ත චිකිත්සක පුහුණුව සඳහා සිසුවියන් බඳවා ගැනීම - 2007

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශයේ අතුරු වෛද්‍ය සේවාවේ පාසල් දන්ත චිකිත්සක පුහුණුව සඳහා සිසුවියන් බඳවා ගැනීම පිණිස සුදුසුකම් ලබා ඇති ශ්‍රී ලංකාවේ පුරවැසි කාන්තාවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. 2003, 2004 අ. පො. ස. (උ. පෙළ) විභාගයෙන් ලබාගන්නා ලද Z අගය අනුව සකස්කළ ප්‍රමුඛතා ලේඛනයක් පදනම් කරගනිමින් සුදුසුකම් ලැබූවන් පාඨමාලාව සඳහා තෝරාගනු ලැබේ.

02. 2.1 මුල් කණ්ඩායම සඳහා ඒ ඒ දිස්ත්‍රික්කවල පවත්නා පුරප්පාඩු පදනම් කරගනිමින් සිසුන් පා ඨමාලාවන් සඳහා තෝරාගනු ලැබේ. දිස්ත්‍රික්ක හා පවත්නා පුරප්පාඩු පහතින් දක්වා ඇත :

| *දිස්ත්‍රික්කය* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|
| ගම්පහ | 20 |
| කළුතර | 13 |
| මහනුවර | 04 |
| මාතලේ | 03 |
| නුවරඑළිය | 03 |
| ගාල්ල | 15 |
| පුත්තලම | 03 |
| අනුරාධපුරය | 10 |
| පොළොන්නරුව | 04 |
| යාපනය | 01 |
| මුලතිව් | 02 |
| මන්නාරම | 01 |
| කිලිනොච්චිය | 02 |
| කල්මුණෛ | 05 |
| අම්පාර | 01 |
| මඩකලපුව | 02 |
| ත්‍රිකුණාමලය | 04 |
| බදුල්ල | 09 |
| මොණරාගල | 08 |
| රත්නපුරය | 04 |
| කෑගල්ල | 03 |

2.2 දෙවැනි කාණ්ඩායමක් බඳවා ගැනීම සඳහා ද මෙම අයදුම්පත් මගින්ම සුදුස්සන් තෝරාගනු ලැබේ. එබැවින් පුරප්පාඩු නොමැති දිස්ත්‍රික්කවල අයට ද අයදුම්කළ හැකිවේ.

03. මෙම පාඨමාලාව පූර්ණ කාලීන පාඨමාලාවක් බැවින් සතියේ දින පහේ සහ සෙනසුරාදා පෙරවරුවේ වෙනත් පාඨමාලා හදාරන සිසුන් මෙම පාඨමාලාව සඳහා අයදුම් නොකළ යුතුයි.

04. පුහුණු කාලය වසර දෙකකි.

05. *අධ්‍යාපන සුදුසුකම් :*

5.1 අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හයකින් සමත් විය යුතුය.

5.2 2003, 2004 අ. පො. ස. (උ. පෙළ) විභාගයට පෙනී සිටි විද්‍යා විෂයය ධාරාවන්ගෙන් අවම වශයෙන් ජීව විද්‍යා විෂයයට සම්මාන සාමාර්ථයක් සහිතව තවත් විෂයයන් දෙකකින් එකවර සමත්වී තිබීම. අයදුම්පතෙහි අ. පො. ස. (උ. පෙළ) විභාගයේ Z අගය ඇතුලත් කිරීම අනිවාර්ය වේ.

06. *අනෙකුත් සුදුසුකම් :*

(අ) උස අඩි 4 අඟල් 10ට වැඩි කාන්තා පක්ෂයේ විය යුතුයි.
(ආ) අවිවාහක විය යුතුය. පුහුණු කාලය තුල අවිවාහකව සිටිය යුතුය.
(ඇ) 2008.01.25 දිනට වයස අවුරුදු 18ට නොඅඩු, වයස අවුරුදු 30ට නොවැඩි විය යුතුය.
(ඈ) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කැමති විය යුතුයි.
(ඉ) මනා ශාරීරික සෞඛ්‍යයකින් යුක්ත විය යුතුයි.
(ඊ) තමන් අයදුම් කරන දිස්ත්‍රික්කය තුල අවුරුදු තුනක් පදිංචිව සිටිය යුතුය.

07. *අයදුම් කළ යුතු ක්‍රමය :*

(අ) මේ සමඟ ඇති ආකෘතිපත්‍රය අනුව අයදුම්පතක් සකස්කර ගත යුතුවේ. අයදුම්පතේ "මුද්දර' යන ස්ථානයේ රුපියල් 500ක මුද්දරයක් අලවා තම අත්සන යොදා එය අවලංගු කළ යුතුවේ.

(ආ) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ/අධ්‍යාපන පරිපාලන සේවයේ/රජයේ ගණකාධිකාරි සේවයේ නිලධාරියෙකු/රජයේ විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/නීතිඥවරයෙකු හෝ වර්ෂයකට රු. 1,24,080 කට නොඅඩු වැටුපක් ලබන රජයේ නිලධාරියෙකු විසින් අපේක්ෂකයාගේ අත්සන සහතික කළ යුතුවේ.

(ඇ) අයදුම්පත් නිසි පරිදි සම්පූර්ණ කර එය බහාලන කවරයේ වම් කෙලවරේ "පාසල් දන්ත චිකිත්සක තනතුරු සඳහා අභ්‍යාසලාභීන් බඳවා ගැනීම" යනුවෙන් සඳහන් කොට 2008 ජනවාරි 25 දින හෝ ඊට පෙර "අධ්‍යක්ෂ (පාලන) 02, සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය, "සුවසිරිපාය", අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

08. අයදුම්පත් ලැබුන බව දන්වා එවනු නොලැබේ.

09. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

10. මෙම නිවේදනයේ දැක්වෙන නියමයන්ට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

11. ඉහත අධ්‍යාපන සුදුසුකම් සහ අනෙකුත් සුදුසුකම් සපුරා ඇති අපේක්ෂිකාවන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී අයදුම්කරුවන් විසින් පහත සඳහන් ලියකියවිලිවල මුල්පිටපත් ඉදිරිපත් කළ යුතුය. සම්මුඛ පරීක්ෂණයේදී අවශ්‍ය සහතික මුල් පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ අපේක්ෂිකත්වය ප්‍රතික්ෂේප කරනු ලැබේ :

(අ) උප්පැන්න සහතිකය ;

(ආ) අධ්‍යාපන සුදුසුකම් පිළබඳ මුල් සහතිකය හෝ මුල් සහතික නිකුත් කර නැති විට බාහිර අයදුම්කරුවන්ට නිකුත් කළ ප්‍රතිඵල ලේඛනය හෝ අයදුම්කරු විභාගයට පෙනී සිටි විදුහලේ විදුහල්පතිවරයා නිකුත් කළ මුල් ලිපිය යනාදී ලිපිලේඛන ;

(ඇ) විභාග දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ අ. පො. ස. (උ. පෙළ) Z ලකුණු සහතිකය ;

(ඈ) ජාතික හැඳුනුම්පත/ගමන් බලපත්‍රය හෝ රියදුරු බලපත්‍රය ;

(ඉ) අවිවාහක බව සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් අනු අත්සන යෙදූ ග්‍රාම සේවා සහතිකය ;

(ඊ) දිස්ත්‍රික්කය තුල අවුරුදු 03කට පදිංචිය සනාථ කිරීම සඳහා 2004, 2005, 2006 ඡන්දදායක ලැයිස්තුවේ සහතික කළ පිටපත්, අයදුම්කරුගේ නම ඡන්දදායක ලැයිස්තුවේ සඳහන්ව නොමැති නම්, ඔහුගේ දෙමාපියන්ගේ නම් ඡන්දදායක ලැයිස්තුවේ සඳහන්ව තිබිය යුතුය. එවැනි අයදුම්කරුවන් විසින් ඡන්දදායක ලැයිස්තුවේ සහතික කළ පිටපතට අමතරව ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කරන ලද ග්‍රාම සේවා නිලධාරියාගෙන් ලබාගත් පදිංචිය පිළිබඳ සහතිකය ඉදිරිපත් කළ යුතුය.

12. *පුහුණු කිරීමේ පරිපාටිය :*

(අ) තෝරාගත් අයදුම්කරුවන් ඉහත පුහුණුව සඳහා මහරගම පුහුණු පාසලට ඇතුලත් කරනු ලැබේ. පාඨමාලාවන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් හැදෑරිය යුතුවේ.

(ආ) පුහුණුව සඳහා ඇතුලත් කරන සිසුවියන් පුහුණු පාසල්වල බල පැවැත්වෙන නීතිරීතිවලට හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් කලින් කලට පනවනු ලබන වෙනත් නියෝගවලට ද යටත් වනු ඇත.

(ඇ) පුහුණුව ලබන කාල පරිච්ඡේදය තුල නියමිත විභාග වලින් අසමත් වන හෝ වැඩ හා හැසිරීම අසතුටුදායක නොවන හෝ පුහුණු පාසලෙහි විභාග හා නිවාඩු කොන්දේසි පිළිපැදීමට අපොහොසත්වන අභ්‍යාසලාභීන්ගේ පුහුණුව ඕනෑම අවස්ථාවක දී වන්දි ගෙවීමකින් තොරව නතර කිරීමට හැකිය.

(ඈ) පුහුණුව ලබන කාල පරිච්ඡේදය තුල සිසුන්ට රු. 6,000ක දීමනාවක් ගෙවනු ලැබේ. මීට අමතරව ජීවන වියදම් දීමනාව ද හිමිවේ.

(ඉ) පුහුණු පාසලට ඇතුලත් වන අවස්ථාවේ දී පුහුණුව සාර්ථකව නිම කරන බවටත්, පුහුණු පාඨමාලාව අත්හැර නොයන බවටත්, එකී පුහුණුව සම්පූර්ණ කිරීමෙන් පසුව පත්වීම් ලැබුවහොත් අවම වශයෙන් අවුරුදු 10ක කාල පරිච්ඡේදයක් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ සේවය කරන බවටත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් සමඟ ගිවිසුමකට එළඹිය යුතුය. පුහුණුව ලබන කාලය තුල පුහුණුවෙන් ඉවත් වුවහොත් හෝ පුහුණුව හැරගියහොත් ඉහත (ඇ) ඡේදය අනුව පුහුණුවෙන් ඉවත් කිරීමට සිදුවුවහොත් පුහුණු කාලය තුල ඇයට ගෙවන ලද දීමනාව හා රජය විසින් දරන ලද වියහියදම් සඳහා වැයවූ මුදල ඇය විසින් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතුවේ. එසේ නොවුවහොත් ගිවිසුම් ප්‍රකාරව එම මුදල් අයකර ගැනීමට නිසි පියවර ගනු ඇත.

13. *සේවයේ නියුක්ත කරවීමේ නියමයන් :*

පුහුණුව අවසානයේ දී ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීමට ද රජය බැඳී නොසිටී. එහෙත් බඳවාගනු ලබන පළාතේ පුරප්පාඩු මත අවසන් පරීක්ෂණයෙන් සමත්වන අපේක්ෂිකාවන්ට දෙපාර්තමේන්තුව මගින් ඔවුන් ලබා ඇති කුසලතාව පදනම් කරගනිමින් අදාල තනතුරේ III පංතියේ තනතුරු සඳහා පත්කරනු ලැබේ. මුල් පත්වීමේ සිට වසර දෙකක් පත්වීමේ මුල් ස්ථානයේ රැඳී සිටිය යුතුයි.

14. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් පිළිබඳ විස්තර ඉල්ලුම්පත්‍ර පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව හා නිවැරදිව ඇතුලත් කළ යුතුය. පුහුණුව සඳහා බඳවා ගැනීමෙන් හෝ පත්වීම ලැබීමෙන් පසු යටකී සහතික ව්‍යාජ බවට ඔප්පු වුවහොත් ඒ දෙනු ලබන පත්වීම අවලංගු කර පුහුණුවෙන්/සේවයෙන් පහකරන අතර නැවත රජයේ සේවයට නොගන්නවුන්ගේ අසාධු ලේඛනයට ඇයගේ නම ඇතුලත් කිරීමට කටයුතු කරනු ලැබේ.

15. තෝරාගත් අයදුම්කාරිය අදාල පාඨමාලාවන් හැදෑරීමට සහ ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කායික සහ මානසික වශයෙන් යෝග්‍යතාවයකින් හෙබි බව සනාථ කරනු වස් වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, වෛද්‍ය පරීක්ෂණයේ දී අයෝග්‍ය බව පෙනී යන අපේක්ෂකයින් පුහුණු පාඨමාලාවේ රැඳී සිටීමට නුසුදුස්සන් වනු ඇත.

16. ඉහත පරිදි බඳවාගනු ලබන සියළුම නිලධාරීන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට, සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් නියම කරනු ලබන ප්‍රතිපත්තිවලට, මුදල් හා වෙනත් රෙගුලාසිවලට ද, රජය විසින් වරින්වර පනවනු ලබන නීතිරීති හා නියෝගයන්ටද යටත්වනු ඇත.

17. පුහුණුවට බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙම *ගැසට්* නිවේදනය මගින් ආවරණය නොවන යම් ගැටළු සහගත කරුණක් උද්ගත උවහොත් ඒ පිළිබඳ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත.

එච්. ඒ. පී. කහඳලියනගේ,
ලේකම්,
සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය.

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය,
"සුවසිරිපාය",
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

## අයදුම්පත්‍රය

*සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය*

*අතුරු වෛද්‍ය සේවාවේ පාසල් දන්ත චිකිත්සක පුහුණුව සඳහා සිසුවියන් බඳවා ගැනීම - 2007*

01. (අ) මුලකුරු සමඟ අගට යෙදෙන නම :————.
(ආ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
02. තැපැල් ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
03. (i) ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
(ii) දිස්ත්‍රික්කය :————.
(iii) ඔබ මෙම දිස්ත්‍රික්කයයේ ස්ථිර පදිංචිකරුවෙක්ද ?
ඔව්/නැත :————.
(iv) ඔව් නම් කොපමණ කලක පටන් ද? :————.
04. උපන් දිනය :
වර්ෂය :————, මාසය :————, දිනය :————.
2008.01.25 දිනට වයස :
අවුරුදු :————, මාස :————, දින :————.
05. ස්ත්‍රී/පුරුෂ භාවය (අදාල කොටුවේ "√" යොදන්න)

| | |
|---|---|
| ස්ත්‍රී | |
| පුරුෂ | |

06. උස : අඩි :————. අඟල් :————.
07. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක්ද යන වග (අදාල කොටුවේ "√" යොදන්න).

| | |
|---|---|
| ඔව් | |
| නැත | |

08. ජාතික හැඳුනුම්පත් අංකය :————.
09. විවාහක අවිවාහක බව :————.
10. අධ්‍යාපන සුදුසුකම් :

(අ) අ. පො. ස. (උ. පෙළ) විභාගය, (විද්‍යා විෂයයන් පමණි)
(ලකුණු සටහන් පිටපත අමුණන්න)
විභාගයට ඉදිරිපත් වූ දිනය :————.
වර්ෂය :————. විභාග අංකය :————.
Z ලකුණ :————.

| *විෂය* | *ශ්‍රේණිය* |
|---|---|
| 01. | |
| 02. | |
| 03. | |
| 04. | |

(ආ) අ. පො. ස. (සා. පෙළ) විභාගය :

*පළමු වාරය* :————.
වර්ෂය :————. විභාග අංකය :————.

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 01. | | 07. | |
| 02. | | 08. | |
| 03. | | 09. | |
| 04. | | 10. | |
| 05. | | 11. | |
| 06. | | 12. | |

*දෙවන වාරය :*

*වර්ෂය* :————. *විභාග අංකය* :————.

| *විෂය* | *ශ්‍රේණිය* | *විෂය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 01. | | 07. | |
| 02. | | 08. | |
| 03. | | 09. | |
| 04. | | 10. | |
| 05. | | 11. | |
| 06. | | 12. | |

11. උසාවියක ඉදිරියේ ඔබ කිසියම් චෝදනාවකට වැරදිකරුවී ඇත්ද ? (අදාල කොටුවේ "√" යොදන්න)

| | |
|---|---|
| ඔව් | |
| නැත | |

'ඔව්' නම් විස්තර සපයන්න. :————.

12. *අයදුම්කරුගේ සහතිකය :*

(අ) මම වෙනත් කිසිදු පූර්ණ කාලීන පාඨමාලාවකට සහභාගි නොවන බවත් මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි.

(ආ) ම විසින් කරනු ලැබ ඇති මෙම ප්‍රකාශය අසත්‍ය බව ඔප්පු වුවහොත් මා පුහුණුවට නුසුදුස්සකු වන බව හා පත්වීම ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත්වන බව මම දැන සිටිමි.

| |
|---|
| මුද්දර කොටුව |

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

13. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ................................මා පෞද්ගලිකව හඳුනන බවත් ඇය 2007............ වැනි දින මා ඉදිරිපිට දී ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන,
නිල මුද්‍රාව සහිතව.

දිනය :————.

සහතික කරන නිලධාරියාගේ –

සම්පූර්ණ නම :————;
තනතුර :————;
ලිපිනය :————.

12-754

මගේ අංකය : බීඩීජ්/1/01/ජ්
ජාතික අයවැය දෙපාර්තමේන්තුව

## අයවැය සහකාර නිලධාරින් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2007

රජයේ ප්‍රමුඛතා කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ හැකියාවන් ප්‍රවර්ධනයට බඳවා ගත් උපාධිධාරි අභ්‍යාසලාභීන් ස්ථිර තනතුරුවලට අනුයුක්ත කිරීම සම්බන්ධව මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ ලේකම්ගේ අංක : බීඩීජ්/1/29/ජ් හා 2000.07.25 දිනැති චක්‍රලේඛ ලිපියෙහි 08 : 03 ඡේදයට අනුව අයවැය අධ්‍යක්ෂ ජනරාල් විසින් පත් කරන ලද අයවැය සහකාර නිලධාරින් සඳහා 2007 වර්ෂය සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් විසින් 2008.02.17 දින කොළඹදී පවත්වනු ලැබේ.

02. (අ) මෙම විභාගය සඳහා ඉල්ලුම් කිරීමේ ආදර්ශ අයදුම්පත්‍රය මෙම නිවේදනය අවසානයේ පළකර ඇත. නිවැරදිව හා පැහැදිලිව පිළියෙල කරන අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් 2008.01.28 දිනට ප්‍රථම "ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව, මහලේකම් කාර්යාලය, කොළඹ 01" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. අයදුම්පත් ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කරන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව විභාගයේ නම සඳහන් කළ යුතුය. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ආ) අයදුම්පත සකස් කළ යුත්තේ තමා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙන් ය.

(ඇ) අයදුම් පත්‍රය 8″ x 12″ ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් පිළියෙල කරගත යුතුය.

03. *හැඳුනුම් පත්‍ර.*–අපේක්ෂකයන් විභාග ශාලාව තුළ දී පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග පරිපාලක සෑහීමට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලි අතුරින් කුමක් හෝ භාර ගනු ලැබේ.

1. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ;
2. පෝස්ට් මාස්ටර් ජනරාල් විසින් නිකුත් කරන ලද වලංගු හැඳුනුම් පත්‍රයක් ;
3. වලංගු විදේශීය ගමන් බලපත්‍රයක් (පාස්පෝට් බලපත්‍රයක්) ;
4. තමා සේවය කරන ස්ථානයේ ප්‍රධානියා විසින් නම හා අත්සන සහතික කරන ලද ඡායාරූපයක්.

04. පළමු වරට මෙම විභාගයට පෙනී සිටින නිලධාරින් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එසේකුදු වුවත් ඉන්පසු වාරවල දී නිලධාරින් විසින් එක්වර සම්පූර්ණ විභාගයට පෙනී සිටින්නේ නම් රු. 150ක් වටිනා මුදල් ඇණවුමක්ද (එක් විෂයයක් සඳහා පමණක් පෙනී සිටින්නේ නම් රු. 75 ක් වටිනා මුදල් ඇණවුමක්ද) ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් නමින් කොළඹ මහලේකම් තැපැල් කාර්යාලයෙන් මාරුකර ගතහැකි වනසේ ලබාගෙන අයදුම් පත්‍රයට අමුණා එවිය යුතුය. මොනම කරුණක් යටතේ වුව ද මෙම ගාස්තුව ආපසු ගෙවනු නො ලැබේ.

05. අයදුම්පත් පිළිගෙන ඇති නිලධාරින්ට විභාග කාල සටහනේ පිටපතක් සමග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනවා ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයන් විසින් විභාග පරිපාලක වෙත ඔවුන්ගේ ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවේශ පත්‍ර නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය පැවැත්වීමට දින 07 කටවත් පෙර ප්‍රවේශ පත්‍ර නොලැබුණහොත්, ප්‍රවේශ පත්‍ර නොලැබුණු බව අයවැය අධ්‍යක්ෂ ජනරාල්ට දැන්විය යුතුය.

06. එක් එක් විෂය සඳහා වෙන් වෙන් වශයෙන් හා එකිනෙකට වෙනස් වූ වාරවල දී පෙනී සිටීමට නිලධාරින්ට හැකිවේ. එසේකුදු වුවත් සාමාර්ථයක් සඳහා මුළු ලකුණුවලින් 40 ක් එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා නිලධාරින් විසින් ලබා ගත යුතුය.

07. *විභාග පරිපාටිය.*– අයවැය සහකාර නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත වනු ඇත.

1 වන ප්‍රශ්න පත්‍රය - කාර්යාල කළමනාකරණය :

කාර්යාල කළමනාකරණයේ දී වැදගත් වන නීති රෙගුලාසි හා චක්‍රලේඛ උපදෙස් පිළිබඳව අවබෝධයක් ලබාගත හැකිවන පරිදි ආයතන සංග්‍රහයේ නියෝග සහ මුදල් රෙගුලාසි 1 වැනි බණ්ඩය ඇසුරින් මෙම ප්‍රශ්න පත්‍රය සකස් කරනු ලැබේ. ආයතන සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද ආවරණය කරනු ලැබේ. i, ii, iv, v, vii, ix, xii, xv, xxiii, xxvi, xxvii, xxx, xxxii, xxxiii පරිච්ඡේද සහ කාර්යාල කටයුතු කාර්යක්ෂම ලෙස පවත්වාගෙන යාමට අදාල වන විෂය දැනුම ඇගයීම

2 වන ප්‍රශ්න පත්‍රය - රාජ්‍ය අයවැය ක්‍රියාවලිය හා මූල්‍ය පාලනය

රාජ්‍ය අයවැය සකස් කිරීමේ දී ප්‍රතිපත්තිමය රාමුව රාජ්‍ය ප්‍රතිපත්තිය හා රාජ්‍ය ආයතනවල කාර්යභාරය රාජ්‍ය අයවැය සැළසුම් කිරීමේ හා සකස් කිරීමේ ක්‍රියාවලිය, අයවැය තීරණය කිරීමේ නිර්නායක, අයවැය ඉදිරිපත් කිරීමේ ආකෘතිය, විසර්ජන ක්‍රියාවලිය වීරමොං ක්‍රියා පටිපාටියට රාජ්‍ය වියදම් පිළිබඳ පසු විපරම් කිරීමේ ක්‍රියාවලිය, ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාව යටතේ කෙරෙන මූල්‍යපාලනය, පාර්ලිමේන්තු රාජ්‍ය ගිණුම් කාරක සභාව හා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව යටතේ කෙරෙන මූල්‍ය පාලනය, විගණකාධිපතිගේ කාර්යභාරය ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරියාගේ හා ගණන් දීමේ නිලධාරියාගේ වගකීම් වොරන්ට් බලපත්‍ර සහ සාමාන්‍ය මූල්‍ය පාලනයෙන් බැහැරවීමේ ක්‍රියාදාමයන් පිළිබඳ අවබෝධය පරීක්ෂා කිරීමට හැකිවන පරිදි මෙම ප්‍රශ්ණ පත්‍රය සකස් කරනු ලැබේ.

3 වන ප්‍රශ්න පත්‍රය - ආර්ථික විද්‍යාව පිළිබඳව න්‍යායාත්මක හා ව්‍යවහාරික කරුණු සහ ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික පසුබිම :

ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට සම්බන්ධ වන රාජ්‍ය නිලධාරියෙකු විසින් ලබා තිබිය යුතු ආර්ථික විද්‍යාව පිළිබඳව න්‍යායාත්මක කරුණු හා ව්‍යවහාරික කරුණු ගැනත් විශේෂයෙන් ශ්‍රී ලංකාවේ සමාජ හා ආර්ථික ප්‍රශ්න පිළිබඳවත් දැනුම විමසීම් සඳහා මෙම ප්‍රශ්න පත්‍රය සකස් කෙරේ.

*සැ. යු.* :- ඉහත සඳහන් 1, 2 සහ 3 වැනි ප්‍රශ්න පත්‍ර සඳහා වූ විභාග සඳහා පැය 2 බැගින් නියම කෙරෙනු ඇත. එකී ප්‍රශ්න පත්‍ර 3 සඳහා එක් ප්‍රශ්න පත්‍රයකට 100 ක් වූ මුළු ලකුණු ප්‍රමාණයෙන් යටත් පිරිසෙයින් ලකුණු 40 බැගින් එක් එක් ප්‍රශ්ණ පත්‍රයට ලබා ගත යුතුය. එකවර විෂයයන් 3 ම සමත්වීමට නොහැකි වූ විට පසු අවස්ථාවක දී/අවස්ථාවන්හි දී ඉතිරිය සම්පූර්ණ කළ හැකිය.

08. මෙම විභාග නිවේදනයට විධි විධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද, ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

ඩබ්. සුධර්මා කරුණාරත්න,
ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්.

අයවැය සහකාර නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2007

විභාග අංකය : [ ]
(කාර්යාලීය ප්‍රයෝජන සඳහා පමණි)

1.0 1.1 මුලකුරු සමග නම :———.

1.2 මුලකුරුවලින් හැඳින්වෙන නම් :———.

1.3 ජාතික හැඳුනුම්පත් අංකය : [ ]

1.3 උපන් දිනය : අවුරුද්ද :——. මාසය :——. දිනය :——.

2.0 අයවැය සහකාර තනතුරට පත්වීම ලද දිනය :———.

3.0 සේවා ස්ථානය හා ලිපිනය :———.

3.1 අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුවේ නම :———.

3.2 රාජකාරී ලිපිනය :———.

(ප්‍රවේශ පත්‍රය එවීම සඳහා)

4.0 විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :———.

(සිංහල/දෙමළ/ඉංග්‍රීසි)

5.0 ගැසට් නිවේදනයේ 08 ඡේදය යටතේ ඔබ ඉදිරිපත් වන විෂයයන් :———.

6.0 ඔබ විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවටද? :———.

එසේ නොවේ නම් විභාග ගාස්තු ගෙවා ලබාගත් (අමුණා ඇති) තැපැල් ගාස්තුව (රු.) :———.

කුවිතාන්සියේ අංකය :———.

දිනය :———.

නිකුත් කළ තැපැල් කාර්යාලය :———.

7.0 අයදුම්කරුගේ සහතිකය :

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මා හට හිමිකම් ඇති බවත්, විභාගය සම්බන්ධයෙන් අයවැය අධ්‍යක්ෂ ජනරාල් විසින් ගනු ලබන තීරණවලට හා විභාග පනතේ සියලු විධිවිධානයන්ට මම යටත්වන බවත් මෙයින් ප්‍රකාශ කරමි. මෙම විභාගය සඳහා පනවා ඇති නීති පිළිබඳව එකඟ වෙමි.

———.
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

8.0 දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :

(i) මෙම අපේක්ෂකයා/අපේක්ෂිකාව මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්තව සිටින අයවැය සහකාර සේවයේ අයවැය සහකාරවරයෙකු/වරියක බව ද,
(ii) ඉහත සපයා ඇති විස්තර නිවැරදි බව ද,
(iii) ඔහු/ඇය මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති බව ද,
මම සහතික කරමි.

———.
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන,
(නිල මුද්‍රාව තැබිය යුතුයි.)

නම :———.
පදවි නාමය :———.
ලිපිනය :———.
දිනය :———.

12-802

---

## ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය
(1984 අංක 18 දරන පාර්ලිමේන්තු පනතකින් ස්ථාපනය කරන ලද්දකි)

ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය

මුද්‍රණ සහ ග්‍රැෆික්ස් පාඨමාලා – 2008

රැකියා සුලභ මුද්‍රණ හා ග්‍රැෆික්ස් ක්ෂේත්‍රයේ විශේෂඥ දැනුම ලබා දෙන්නා වූ රජයේ වෘත්තීය පුහුණු ආයතනයට එක් වී ඔබත් සුදුසුකම් ලැබූ මුද්‍රණ හා ග්‍රැෆික්ස් කර්මාන්තයේ පෙරමුණේ සිටින්න.

මුද්‍රණ හා ග්‍රැෆික්ස් ආයතනවල අවශ්‍යතාවයන්ට අනුව ක්‍රමානුකූලව පිළියෙල කොට ඇති මෙම විෂයමාලා ප්‍රවීණ ආචාර්ය මණ්ඩලයක් යටතේ හැදෑරීමට සලස්වා ඇත.

| | *පාඨමාලා* | *පාඨමාලා කාලය* | *පාඨමාලා ගාස්තු* |
|---|---|---|---|
| 01. | පරිගණක ආශ්‍රිත අකුරු ඇමිණීම හා සැලසුම් කිරීම (Computer Typesetting & Desktop Publishing) | පැය 114 | රු. 8,500 |
| 02. | පරිගණක ආශ්‍රිත මුද්‍රණ සැලසුම් රටා (Computer Graphic Designing) | පැය 144 | රු. 11,000 |
| 03. | දෛශික රූ රටා නිර්මාණය (Adobe Illustrator & Macromedia Freehand) | පැය 16 | රු. 7,000 |
| 04. | වෙබ් අඩවි නිර්මාණය (Web Designing) | පැය 20 | රු. 11,500 |

| පාඨමාලා | පාඨමාලා කාලය | පාඨමාලා ගාස්තු |
|---|---|---|
| 05. මුද්‍රණ සැලසුම් රටා (Design for Print) | පැය 26 | රු. 8,500 |
| 06. ඩිජිටල් පෙර මුද්‍රණය (Digital Pre-press) | පැය 36 | රු. 16,000 |
| 07. ඕෆ්සෙට් ලිතෝකරණය (Offset Lithography) | පැය 26 | රු. 10,500 |
| 08. මුද්‍රණ ශිල්පයට අදාළ පිරිවැයකරණය හා ඇස්තමේන්තුකරණය (Costing & Estimating for Printers) | පැය 26 | රු. 8,500 |
| 09. පොත් බැඳුම්කරණය සහ නිමාව (Book Binding & Finishing) | පැය 36 | රු. 10,000 |
| 10. පත්ලිතෝ යන්ත්‍ර ක්‍රියාකරණය (Sheet Fed Litho Press Operations) | පැය 26 | රු. 10,500 |
| 11. අධීක්ෂකවරුන් සඳහා කළමනාකරණය (Management for Supervisors) | පැය 16 | රු. 7,500 |
| 12. පාසල් හැරයන්නන් සඳහා ඕෆ්සෙට් ලිතෝකරණය (Offset Litho Press Operations for School Leaver) | පැය 56 | රු. 15,000 |
| 13. මුද්‍රණ සැලසුම්කරණය සහ මුද්‍රණ තහඩු සැකසීම (Conventional & Digital Planning & Plate Making) | සති 12 | රු. 7,000 |
| 14. අරේඛිය සංස්කරණය (Non Linear Editing) | පැය 12 | රු. 16,000 |
| 15. ද්විමාන සහ ත්‍රිමාණ ආංකීය සජීවිකරණය (Digital Animation) | පැය 24 | රු. 16,000 |
| 16. මුද්‍රණ හා ග්‍රැෆික් ක්ෂේත්‍රයට අදාළ පරිගණක දෘඪාංග එකළස් කිරීම සහ සැකසීම (Computer Hardware & PC Assembly for Graphic Arts Industry) | පැය 08 | රු. 7,500 |
| 17. මුද්‍රණ නිෂ්පාදන කළමනාකරණය (Print Production Management) | මාස 06 | රු. 15,000 |
| 18. පරිගණක ආශ්‍රිත මුද්‍රණ රටා පිළිබඳ ඩිප්ලෝමාව (Diploma in Computer Graphic Design) | අවුරුදු 1 | රු. 25,000 |
| 19. මුද්‍රණ තාක්ෂණය සහ කළමනාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව (Advanced Diploma in Printing Technology & Management | වසර 2 1/2 | |
| 20. දෘශ්‍ය සංනිවේදන හා කළමනාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව (Advanced Diploma in Visual Communication & Management | වසර 2 1/2 | |

*ස්ථානය.*–රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ පිහිටි ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ වායු සමීකරණය කරන ලද දේශන ශාලාවල මෙම පන්ති පැවැත්වේ.

*පංති.*–සෑම පාඨමාලාවකම පංති සතියකට වරක් හෝ දෙවරක් සතියේ හෝ සති අග දිනවල පැවැත්වේ. අයදුම්පත් සහ විස්තර පත්‍රිකා පහත සඳහන් කාර්යාලයෙන් පැමිණ හෝ දුරකථන අංක වලින් අමතා ලබා ගත හැක.

පාඨමාලා සාර්ථකව නිමකරන සිසුන්ට රජය පිළිගත් සහතිකයක් ප්‍රදානය කෙරේ.

ශාඛා - ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - බේරුවල.
දුරකථන : 0342279881/0714286261

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතලේ
දුරකථන අංක : 0714895044

ලේඛකාධිකාරී, ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය (ප්‍රධාන ශාඛාව)
අංක 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08.
දුරකථනය : 2686162, 2679791
ෆැක්ස් : 2686162 ඊමේල් Sliopreg@sltnet.lk

12-878

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.